සැ. යු. - මෙවර පළවන ගැසට් පත්‍රයේ VI වන කොටසේ 2026 වර්ෂය සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත්, අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 2,503 - 2026 අගෝස්තු මස 21 සිකුරාදා - 2026.08.21**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස : II (ආ) ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... | — |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... | — |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට්* පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට්* පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 සැප්තැම්බර් මස 11 දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 අගෝස්තු මස 28 දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට්* පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට්* පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


1733 - B 082823 — (2026/08)
F 1 -

# බඩු බාහිරාදිය විකිණීම්

**මහෙස්ත්‍රාත් අධිකරණය - නාරම්මල**

රාජසන්තක කරනු ලැබූ හා හිමිකරුවන් හඳුනා නොගත් රථ වාහන හා රාජසන්තක කරන ලද හා අධිකරණය මගින් වෙන්දේසියට නියම කරන ලද නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම අධිකරණය මගින් රාජ සන්තක කරනු ලැබූ හා හිමිකරුවන් හඳුනා නොගත් වාහන හා රාජසන්තක කරන ලද හා අධිකරණය මගින් වෙන්දේසියට නියම කරන ලද නඩු භාණ්ඩ **2026.09.05** දින පෙ.ව. **9.00**ට නාරම්මල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. උපලේඛනයේ සඳහන් වන වාහන හා නඩු භාණ්ඩ පිළිබඳ හිමිකම් දක්වන යම් තැනැත්තෙක් සිටී නම්, වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින පෙ.ව. **8.30**ට පෙර ස්වකීය හිමිකම් තහවුරු කළ යුතුය.

03. රෙජිස්ට්‍රාර්වරියගේ නිසි අවසරය ලබා ගෙන වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර අදාළ නඩුභාණ්ඩ මහජනයාට පරීක්ෂා කර බැලිය හැකිය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව පිළිනොගන්නා අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ මිල දී ගනු ලබන නඩුභාණ්ඩ එම අවස්ථාවල දීම මුදල් ගෙවා වෙන්දේසි භූමියෙන් ඉවත් කර ගත යුතුයත සියලුම ගෙවීම් මුදලින් පමණක් ගෙවිය යුතු අතර, චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

06. වෙන්දේසියෙන් භාණ්ඩ මිල දී ගැනීමට පැමිණෙන ගණුදෙනුකරුවන් තම අනන්‍යතාවය තහවුරු කිරීම පිණිස ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

**එච්. සී. එස්. ඩී. ජයසිංහ,**
මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය - නාරම්මල.

2026 අගෝස්තු මස 13 වැනි දින,
නාරම්මල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *අධිකරණය මගින් ලබා දෙන ලද නව AR අංකය හෝ නඩු අංකය* | *අධිකරණය මගින් ලබා දෙන ලද හඳුනා ගැනීමේ අංකය හෝ පී.ආර්. අංකය* | *භාණ්ඩ විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 01. | AR/474/26 | 6 | රතු පා හෙල්මට් | 1 |
| 02. | AR/474/26 | 11 | ඇලුමිනියම් පොඩි කෝප්ප | 1 |
| 03. | AR/474/26 | 20 | මෝල් පටි රෝලක් (ඔතන ලද) | 1 |
| 04. | AR/474/26 | 21 | කම්පියුටර් මදර් බෝඩ් | 5 |
| 05. | AR/474/26 | 24 | යකඩ කැබලි | 2 |

| අනු. අංකය | අධිකරණය මගින් ලබා දෙන ලද නව AR අංකය හෝ නඩු අංකය | අධිකරණය මගින් ලබා දෙන ලද හඳුනා ගැනීමේ අංකය හෝ පී.ආර්. අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|---|
| 06. | AR/474/26 | 33 | සිංගර් වර්ගයේ වතුර මෝටරය | 1 |
| 07. | AR/474/26 | 37 | දොර ලොක් කැබලි | තොගය |
| 08. | AR/474/26 | 55 | අත් ට්‍රැක්ටර් පනගන්වන හැඬලය | 1 |
| 10. | AR/474/26 | 94 | සිදුරු සහිත ඇලුමිනියම් මුට්ටිය | 1 |
| 11. | AR/474/26 | 96 | කුඩා ප්‍රමාණයේ යකඩ කම්බි රෝල් | 1 |
| 14. | AR/474/26 | 116 | යතුරු පැදියක කොටස් කැබලි | තොගය |
| 15. | AR/474/26 | 122 | යකඩ ග්‍රිල් | 1 |
| 16. | AR/474/26 | 124 | අබලි තහඩු බාල්දිය, එල් අයරින් කැබැල්ලක් සහ තරාදි උතුර කොටස (එල්ලන කැබැල්ල) | - |
| 17. | AR/474/26 | 126 | අබලි ප්ලාස්ටික් බේසම් | 1 |
| 18. | AR/474/26 | 139 | වාහන ඩිපරන්සල් පොල්ල, යකඩ පටි සහිත රවුම් 02ක් සවිකරන ලද තවත් යකඩ බාර් 02 | - |
| 19. | AR/474/26 | 143 | යතුරු පැදියක ඉදිරිපස ලයිට් 01,<br>සුසුකි වර්ගයේ ඉන්ධන ටැංකිය,<br>ප්ලාස්ටික් සයිඩ් කප් 01,<br>(GS 125) පිටුපස මඩ්ගාඩ් කොටස,<br>ඉදිරිපස මඩ්ගාඩ් 01,<br>රිම් 02 ක් සහ ටයරය | - |
| 20. | AR/474/26 | 150 | Sony වර්ගයේ අබලි කැසට් යන්ත්‍රය | 1 |
| 21. | AR/474/26 | 154 | නයිලෝන් කඹය සහ ලණු කඹය | - |
| 23. | AR/474/26 | 165 | යතුරු පැදියක ෂොකට් | 1 |
| 24. | AR/474/26 | 171 | තාච්චි | 2 |
| 25. | AR/474/26 | 172 | බෙහෙත් කොටන, ගල් වලින් සකස් කරන ලද කුඩා රවුම් හැඩැති කුඩා භාජනය | 1 |
| 26 | AR/474/26 | 174 | මෝටර් සයිකල් බැටරි | 3 |
| 27 | AR/474/26 | 180 | ඇලුමිනියම් කර මුඩි | 1 |
| 28 | AR/474/26 | 185 | වයර් කැබලි 02,<br>අඩු මිටියක් අඩංගු අබලි සුදු පාට බකට් 01 | - |

| අනු. අංකය | අධිකරණය මගින් ලබා දෙන ලද නව AR අංකය හෝ නඩු අංකය | අධිකරණය මගින් ලබා දෙන ලද හඳුනා ගැනීමේ අංකය හෝ පී.ආර්. අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|---|
| 29 | AR/474/26 | 196 | කොළ පැහැති හැමර් යන්ත්‍රය | 1 |
| 30 | AR/474/26 | 200 | ඇලුමිනියම් මුට්ටිය | 1 |
| 31 | AR/474/26 | 205 | කොළ පැහැති නයිලෝන් ලණු 01 | 1 |
| 32 | AR/474/26 | 206 | ඇලුමිනියම් සාස්පාන්,<br>ඇලුමිනියම් ජෝගුව,<br>ඇලුමිනියම් රොටී තැටිය | තොගය |
| 33 | AR/474/26 | 214 | ප්ලාස්ටික් බකට් 02,<br>යකඩ දම්වැල් කැබැල්ලක්,<br>පොරෝ තලයක්,<br>හුණු කොස්සක්,<br>නූල් පන්දුව | - |
| 35 | AR/474/26 | 221 | මෝටරයක කොටසක් | 1 |
| 36 | AR/474/26 | 231 | GLOBAL වර්ගයේ සුදු පැහැති බැටරි | 1 |
| 37 | AR/474/26 | 235 | මෝටර් | 1 |
| 38 | AR/474/26 | 242 | මෝටරයක කොටසක් | 1 |
| 39 | AR/474/26 | 259 | වාහනයක සිග්නල් ලයිට් කොටස් | 1 |
| 40 | AR/474/26 | 261 | දුඹුරු පැහැති ටෝච් | 1 |
| 41 | AR/474/26 | 264 | අඬු | 1 |
| 42 | AR/474/26 | 265 | පුලි 04 ලිප් (රෙගියුලේටරය සහිත) | 1 |
| 43 | AR/474/26 | 267 | පුලි 04 ලිප් | 1 |
| 44 | AR/474/26 | 268 | පුලි 02 ලිප් (රෙගියුලේටරය සහිත) | 1 |
| 45 | AR/474/26 | 273 | වාහන හෙඩ් ලයිට් | 2 |
| 46 | AR/474/26 | 274 | දොර ජනෙල් වල අගුළු කොටස් | තොගය |
| 47 | AR/474/26 | 277 | පියන රහිත සුදු පැහැති රයිස් කුකර් එකක කොටසක් | 1 |

| අනු. අංකය | අධිකරණය මගින් ලබා දෙන ලද නව AR අංකය හෝ නඩු අංකය | අධිකරණය මගින් ලබා දෙන ලද හඳුනා ගැනීමේ අංකය හෝ පී.ආර්. අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|---|
| 48 | AR/474/26 | 281 | බිඳෙන පිඟන් 10<br>දීසි 03 | - |
| 49 | AR/474/26 | 282 | බෝල මිටි | 1 |
| 50 | AR/474/26 | 283 | අබලි නිල් පැහැති ප්ලාස්ටික් බාල්දිය | 1 |
| 51 | AR/474/26 | 285 | දුම් කබල | 1 |
| 52 | AR/474/26 | 286 | යකඩ තාච්චිය,<br>ගෑස් ලිප් කොටස් 01,<br>යකඩ කැබලි 01 | 1 |
| 53 | AR/474/26 | 290 | YUASA බැටරි | 1 |
| 54 | AR/474/26 | 292 | කුළු ගෙඩි | 1 |
| 55 | AR/474/26 | 293 | යකඩ බාල්දි | 1 |
| 56 | AR/474/26 | 296 | උණු වතුර බෝතලය (රතු පාට) | 1 |
| 57 | AR/474/26 | 316 | නිල් පැහැති ගෑස් සිලින්ඩරය | 1 |
| 59 | AR/474/26 | 325 | අලවංගු | 1 |
| 60 | AR/474/26 | 329 | යකඩ කටුව | 1 |
| 62 | AR/474/26 | 346 | යකඩ බට | 1 |
| 63 | AR/474/26 | 347 | මිට සහිත යකඩ පට්ටම | 1 |
| 64 | AR/474/26 | 349 | යකඩ කටුව | 1 |
| 65 | AR/474/26 | 350 | යකඩ කටුව | 1 |
| 66 | AR/474/26 | 351 | යකඩ බට | 1 |
| 67 | AR/474/26 | 352 | යකඩ කටුව | 1 |
| 68 | AR/474/26 | 355 | යකඩ පටි | 1 |
| 69 | AR/474/26 | 363 | යකඩ බට | 1 |

| අනු. අංකය | අධිකරණය මගින් ලබා දෙන ලද නව AR අංකය හෝ නඩු අංකය | අධිකරණය මගින් ලබා දෙන ලද හඳුනා ගැනීමේ අංකය හෝ පී.ආර්. අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|---|
| 70 | AR/474/26 | 372 | ලී මිට සහිත කුඩා උදලු | 1 |
| 71 | AR/474/26 | 374 | කැඩුණු මිට සහිත කුඩා උදලු | 1 |
| 72 | AR/474/26 | 377 | කුඩා ලී මිට සහිත උදලු | 1 |
| 73 | AR/474/26 | 394 | කුඩා පත්ත | 1 |
| 74 | AR/474/26 | 449 | පොරොව | 1 |
| 76 | AR/474/26 | 457 | පත්තක් | 1 |
| 78 | AR/474/26 | 482 | මීටර් කෝඩු | 1 |
| 79 | AR/474/26 | 549 | මල්ටි ප්ලග් | 1 |
| 80 | AR/474/26 | 601 | යකඩ බට | 2 |
| 81 | AR/474/26 | 602 | වී මෝලක ඇක්සලය සහ යකඩ රෝද | 3 |
| 82 | AR/474/26 | 603 | යකඩ බට කොටසක් සවිකරන ලද රිම් එක | 1 |
| 83 | AR/474/26 | 604 | කරත්ත රෝදය | 1 |
| 84 | AR/474/26 | 605 | රිම් එක | 1 |
| 85 | AR/474/26 | 606 | රතු පැහැති ප්ලාස්ටික් මාර්ග බාධක සඳහා භාවිතා කරනු ලබන කෝන් | 1 |
| 86 | AR/474/26 | 554 | කුඩා සෙරෙප්පු යුගලය | 1 |
| 87 | අංක රහිත | අංක රහිත | කළු පැහැති 500 L ප්‍රමාණයේ ආර්පිකෝ ජල ටැංකි | 1 |
| 88 | AR/474/26 | | හෙල්මට් | 2 |
| 89 | 11672 | 195/26 | කටුව සහිත හැමර් යන්ත්‍රය | 1 |
| 90 | 11672 | 196/26 | යකඩ ඉනි | 2 |
| 91 | 11672 | 196/26 | බෝර කටු | 1 |

| අනු. අංකය | අධිකරණය මගින් ලබා දෙන ලද නව AR අංකය හෝ නඩු අංකය | අධිකරණය මගින් ලබා දෙන ලද හඳුනා ගැනීමේ අංකය හෝ පී.ආර්. අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|---|
| 92 | 11672 | 196/26 | යකඩ ග්‍රිල් කටුව | 1 |
| 93 | 11672 | 197/26 | හිස් තීන්ත බාල්දිය<br>සුදු පාට කඹය<br>වයර් 001<br>රවුම් බල්බය හා හෝල්ඩරය | - |
| 94 | 11672 | 198/26 | උදැල්ල | 1 |
| 95 | 11672 | 198/26 | මිටිය | 1 |
| 96 | AR/1009/16 | | ටින්කරින් කිරීමට ගන්නා ලොකු ඔක්සිජන් ගෑස් සිලින්ඩරය හා ගෑස් ලාම්පුව | 1 |
| 97 | A/1226/16 | | ලොකු ටයර් | 5 |
| 98 | 67578 | 838/19 | NW TI-2947 දරන යතුරු පැදිය | 1 |
| 99 | B/7348/25 | 501/25 | SB-5846 දරන අත් ට්‍රැක්ටරය හා ට්‍රේලරය | 1 |
| 100 | AR/2353/14 | LOT 11 | චැසි අංක LLCLP110831B26341<br>දරන යතුරු පැදිය (අබලි) | 1 |
| 101 | B/7976/25 | 1521 | NW GW-8164 දරන යතුරු පැදිය (අබලි) | 1 |

රාජසන්තක කර ඇති හා හිමිකරුවන් හඳුනාගත නොහැකි වාහන හා නඩු භාණ්ඩ පිළිබඳ තක්සේරු මණ්ඩලයක් මගින් වාර්තාවේ ගෙන ඇත.

08-247

---

## මහෙස්ත්‍රාත් අධිකරණය - ගාල්ල

ගාල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුභාණ්ඩ වශයෙන් ඇති රාජසන්තක කරනු ලද හා මෙතෙක් හිමිකම් පෑමක් නොකළ පහත සඳහන් භාණ්ඩ 2026.09.13 වෙනි ඉරිදා දින පෙ.ව. 9.30ට අධිකරණ භූමියේ දී හා බෙලිගහ නව අධිකරණ සංකීර්ණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01. මෙහි පහත සඳහන් භාණ්ඩයක් සඳහා හිමිකම්පාන්නෙකු වේ නම් වෙන්දේසිය ආරම්භ වීමට පෙර ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතුය.

02. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත එදින වෙන්දේසිය පැවැත්වීමට විනාඩි 30කට පෙර භාණ්ඩ පරීක්ෂා කළ හැකිය.

03. අධිකරණය මගින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවන්හි දී අධිකරණයේ අභිමතය පරිදි ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ පූර්ණ අයිතිය අධිකරණය සතුව පවතී.

04. වෙන්දේසියෙන් මිල දී ගනු ලබන භාණ්ඩ සඳහා එවෙලේම මුදල් ගෙවා එකී භාණ්ඩය අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

05. භාණ්ඩ ගැනුම්කරුවන භාණ්ඩ මිල දී ගැනීමේ දී ඔවුන්ගේ ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

**එම්. ඩී. එස්. පී. දොඩන්ගොඩ,**
මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය - ගාල්ල.

2026 අගෝස්තු මස 10 වැනි දින,
ගාල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|---|---|
| 01 | AR 3874/26 | US -6170 යතුරු පැදිය | 01 |
| 02 | AR 3876/26 | BDK 2679 යතුරු පැදිය | 01 |
| 03 | AR 3873/26 | BEP 2602 යතුරු පැදිය | 01 |
| 04 | AR 3875/26 | HX 1324 යතුරු පැදිය | 01 |
| 05 | AR 3877/26 | VU - 7419 යතුරු පැදිය | 01 |
| 06 | AR 4518/25 | බොයිලේරු | 01 |
| 07 | නඩු අංක රහිත | යතුරු පැදි රෝද | 02 |
| 08 | විවිධ නඩු අංක යටතේ | එකතු වූ යකඩ බැරල් | තොගය |
| 09 | විවිධ නඩු අංක යටතේ | පස් | සංචිතය |
| 10 | BR 3154/25 | ජංගම දුරකථන | 01 |
| 11 | BR 1038/24 | ජංගම දුරකථන | 01 |
| 12 | 1981/24 (75959) | ජංගම දුරකථන | 02 |
| 13 | AR 3141/26 | ජංගම දුරකථන | 02 |
| 14 | නඩු අංක රහිත | ජංගම දුරකථන | 23 |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 15 | BR 1270/24 | ජංගම දුරකථන | 01 |
| 16 | BR 2701/24 | ජංගම දුරකථන | 01 |
| 17 | BR 3197/24 | ජංගම දුරකථන | 01 |
| 18 | B 723/24 | ජංගම දුරකථන | 01 |
| 19 | BR 4519/25 | ගෑස් ලිප් | 01 |
| 20 | BR 4519/25 | 12.5 kg ගෑස් සිලින්ඩර | 01 |
| 21 | BR 4519/25 | අත් පොරොව | 01 |
| 22 | BR 4519/25 | කැති | 02 |
| 23 | BR 4519/25 | කුඩා නියන් | 06 |
| 24 | BR 4519/25 | 13 බොක්ස් යතුරු | 01 |
| 25 | BR 4519/25 | 13 අත් යතුරු | 01 |
| 26 | BR 4519/25 | ලීටර් 25 බාස්කට් | 01 |
| 27 | 3722/23 | ගැල්වනයිස් බට | අඩි 03 |
| 28 | 5799/26 | 12V බැටරි | 02 |
| 29 | 5799/26 | LED ලයිට් | 03 |
| 30 | 5799/26 | රවුම් ලයිට් | 01 |
| 31 | 15286/26 | LED ලයිට් | 01 |
| 32 | 11436/26 | LED ලයිට් | 01 |
| 33 | 11442/26 | LED ලයිට් | 01 |
| 34 | 11444/26 | බෙල් ස්විච් | 01 |
| 35 | 11435/26 | වයර් කෝඩ් | 01 |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 36 | 10945/26 | වයර් කෝඩ් | 01 |
| 37 | 9820/26 | වයර් කෝඩ් | 01 |
| 38 | 1347/26 | 12V බැටරි | 02 |
| 39 | 1347/26 | LED ලයිට් | 02 |
| 40 | 1347/26 | රවුම් ලයිට් | 01 |
| 41 | 12681/26 | 12.5kg ගෑස් සිලින්ඩර් | 01 |
| 42 | 12426/26 | විදුලි බල්බ | 01 |
| 43 | 12976/26 | වයර් කෝඩ් | 01 |
| 44 | 36777 | CPU යන්ත්‍ර | 01 |
| 45 | 36777 | ජංගම දුරකථන | 01 |
| 46 | 17000/26 | ගෑස් ලිප් | 04 |
| 47 | 15171 | 12.5kg ගෑස් සිලින්ඩර් | 01 |
| 48 | 14171 | ගෑස් ලිප් | 02 |
| 49 | 8347 | වක් පිහි | 01 |
| 50 | 1431/26 | කැති | 01 |
| 51 | 13093/26 | අත් කියත් | 01 |
| 52 | 13093/26 | නියන් | 01 |
| 53 | 8348/26 | වක් පිහි | 01 |
| 54 | 12978/26 | අඳනකඩ | 01 |
| 55 | 12977/26 | අඳනකඩ | 01 |
| 56 | 98908/25 | උදලු | 01 |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 57 | 15618 | බාස්කට් | 01 |
| 58 | 13902 | බාස්කට් | 01 |
| 59 | 14411 | බාස්කට් | 01 |
| 60 | 8938 | ඇලුමිනියම් හට්ටි | 01 |
| 61 | 8938 | ඇලුමිනියම් තාච්චි | 01 |
| 62 | 1867 | ආරක්ෂිත හිස්වැසුම් | 01 |
| 63 | 15286/26 | LED බල්බ | 01 |
| 64 | විවිධ අංක යටතේ | එකතු වූ වීදුරු බෝතල් | තොගය |
| 65 | විවිධ අංක යටතේ | එකතු වූ ප්ලාස්ටික් කෑන් | තොගය |
| 66 | නඩු භාණ්ඩ අංශයෙන් ඉවත් කරන ලද අබලි තඹ | | තොගය |

2025 ගාල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ භාණ්ඩ සමීක්ෂණයෙන් ඉවත් කරන ලද භාණ්ඩ

මහෙස්ත්‍රාත් අධිකරණ කාර්යාලය

| | |
|---|---|
| ප්ලාස්ටික් පුටු | 02 |
| වානේ කබඩ් | 04 |
| ලී කබඩ් | 01 |
| මේස විදුලි පංකා | 01 |
| ඡායා පිටපත් යන්ත්‍ර | 01 |
| පරිගණක මොනිටර් | 04 |
| පරිගණක යූපීඑස් | 04 |
| ඩිජිටල් උෂ්නත්වමාන | 03 |
| රවුටර් | 01 |

08-250

**මහෙස්ත්‍රාත් අධිකරණය - කළුතර**

අධිකරණයට ඉදිරිපත් කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කළුතර මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරන ලද, මෙතෙක් හිමිකම් නොකියන ලද සහ වෙන්දේසි කිරීමට නියම කරන ලද මෙම පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ **2026.09.05** දින පෙ.ව. **10.00**ට අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01. මෙම උපලේඛනයේ සඳහන් කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් කියන්නකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතුය. වෙන්දේසියෙන් පසුව ඉදිරිපත් කරන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ. රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැක.

02. අධිකරණය විසින් නියම කරන අවම ලංසුව නොපිළිගන්නා අවස්ථාවන්හි දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත්කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

03. වෙන්දේසියෙන් මිල දී ගන්නා භාණ්ඩ සඳහා එම අවස්ථාවේ දීම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත්කර ගත යුතුය. සියලුම ගෙවීම් මුදලින් කළ යුතු අතර, චෙක්පත් හා මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

04. වෙන්දේසියේදී භාණ්ඩ මිල දී ගනු ලබන අය විසින් තමාගේ අනන්‍යතාවය ජාතික හැඳුනුම්පත මගින් තහවුරු කළ යුතුය.

මහේෂ් වාකිෂ්ඨ,
මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය - කළුතර.

2026 ජුලි මස 31 දින,
කළුතර මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**උපලේඛනය**

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | වෙනත් |
|---|---|---|---|
| 01 | BR 2886/22 | WP BDT 3079 දරන යතුරු පැදිය | |
| 02 | BR 2321/25 | JY 3297 දරන යතුරු පැදිය | |
| 03 | BR 2641/25 | EP BAI 8717 දරන යතුරු පැදිය | |
| 04 | AR 1017/26 | BFU 4890 දරන යතුරු පැදිය | |
| 05 | AR 2503/26 | TVS වර්ගයේ දරන යතුරු පැදිය | |
| 06 | AR 2502/26 | අංක තහඩු රහිත සුසුකි වර්ගයේ යතුරු පැදිය | |
| 07 | 64060 | ලිට්‍රෝ 12.5 KG ගෑස් සිලින්ඩර් 01 | |
| 08 | 81052 | එම | |
| 09 | 76978 | එම | |
| 10 | PR 356/26 | එම | |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | වෙනත් |
|---|---|---|---|
| 11 | 42702 | එම | |
| 12 | BR 807/21 | එම | |
| 13 | (PR 35/26) | එම | |
| 14 | BR 2549/25 | එම | |
| 15 | 71866 | එම | |
| 16 | 80346 | එම | |
| 17 | 83124 | එම | |
| 18 | BR 8667/24 | එම | |
| 19 | 71431 | එම | |
| 20 | 74472 | එම | |
| 21 | 76746 | එම | |
| 22 | 77330 | එම | |
| 23 | 21617 | එම | |
| 24 | 55652 | ලිට්‍රෝ 5 KG ගෑස් සිලින්ඩර් 01 | |
| 25 | AR 3768/25 | එම | |
| 26 | 10170 | එම | |
| 27 | 68163 | එම | |
| 28 | 14829 | ලිට්‍රෝ 2.3 KG ගෑස් සිලින්ඩර් 01 | |
| 29 | 86470 | ලාෆ් 12.5 KG ගෑස් සිලින්ඩර් 01 | |
| 30 | 86470 | ලාෆ් 12.5 KG ගෑස් සිලින්ඩර් 01 | |
| 31 | 64060 | එම | |
| 32 | AR 1301/26 | එම | |
| 33 | 23467 | එම | |
| 34 | අංක රහිත<br>PR 2866/25 | එම | |
| 35 | 82257 | එම | |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | වෙනත් |
|---|---|---|---|
| 36 | 57719 | එම | |
| 37 | 80869 | එම | |
| 38 | 83723 | එම | |
| 39 | 81062 | එම | |
| 40 | 18803 | එම | |
| 41 | 54028 | එම | |
| 42 | 87052 | එම | |
| 43 | BR 3494/15 | ලාෆ් 2.5 KG ගෑස් සිලින්ඩර් 01 | |
| 44 | 64060 | එම | |
| 45 | 70823 | ජංගම දුරකතන 01 | |
| 46 | 87199 | ගෘහස්ථ පිහි 01 | |
| 47 | 83725 | පාසැල් බෑග් 01 | |
| 48 | 84154 | පාසැල් බෑග් 01 | |
| 49 | 81047 | කාන්තා අත් බෑග් 01 | |
| 50 | 85270 | වැලි කියුබ් 03 | |
| 51 | 84528 | වැලි කියුබ් 03 1/2 | |
| 52 | 844811 | වැලි කියුබ් 03 | |
| 53 | 84809 | වැලි කියුබ් 03 | |
| 54 | 87052 | යකඩ ගෑස් ලිප් 01 | |
| 55 | 87321 | එම | |
| 56 | 72166 | එම | |
| 57 | අංක රහිත | එම | |
| 58 | අංක රහිත | එම | |
| 59 | අංක රහිත | එම | |
| 60 | අංක රහිත | එම | |
| 61 | අංක රහිත | යකඩ ගෑස් ලිප් 01 | |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | වෙනත් |
|---|---|---|---|
| 62 | අංක රහිත | එම | |
| 63 | අංක රහිත | එම | |
| 64 | අංක රහිත | එම | |
| 65 | අංක රහිත | එම | |
| 66 | 87327 | යකඩ බැරල් 01 | |
| 67 | 86540 | එම | |
| 68 | 86541 | එම | |
| 69 | 86485 | එම | |
| 70 | 86098 | එම | |
| 71 | 86099 | එම | |
| 72 | 96777 | එම | |
| 73 | 95340 | එම | |
| 74 | 41708 | අඩි 38 පමණ දිග රබර් නල 01 | |
| 75 | 41708 | අඩි 33 පමණ දිග රබර් නල 01 | |
| 76 | 41707 | අඩි 16 පමණ දිග රබර් නල 01 | |
| 77 | 41707 | අඩි 25 පමණ දිග රබර් නල 01 | |
| 78 | 41707 | අඩි 27 පමණ දිග රබර් නල 01 | |
| 79 | 47931 | අඩි 28 පමණ දිග රබර් නල 01 | |
| 80 | 44600 | අඩි 27 පමණ දිග රබර් නල 01 | |
| 81 | 44601 | අඩි 21 පමණ දිග රබර් නල 01 | |
| 82 | අංක රහිත | පුට වැල් එකක් සවිකරන ලද අඩි 20ක් පමණ දිග රබර් නල 01 | |
| 83 | 87825 | කිරි මැටි කියුබ් 3 1/2 | |
| 84 | 87824 | කිරි මැටි කියුබ් 3 1/2 | |
| 85 | අංක රහිත | වීදුරු බෝතල් තොගය | |
| 86 | අංක රහිත | ප්ලාස්ටික් බෝතල් හා බූලි තොගය | |

08-240

**කළුතර සිවිල් අභියාචනා මහාධිකරණයේ පරිහරණයෙන් ඉවත් කරන ලද කාර්යාලීය උපකරණ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

01. කළුතර සිවිල් අභියාචනා මහාධිකරණයේ භාණ්ඩ සමීක්ෂණය මගින් ඉවත් කරන ලද කාර්යාලීය උපකරණ **2026.09.10** වන දින **ප.ව. 2.00**ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර, වෙන්දේසියට නියමිත භාණ්ඩ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය පරිදි මහජනතාවට පරීක්ෂා කර බැලිය හැක.

03. වෙන්දේසියෙන් මිළ දී ගන්නා භාණ්ඩ එම අවස්ථාවේ දී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර, සියලුම ගෙවීම් මුදල් වලින් පමණක් සිදුකළ යුතුය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවේ අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් භාණ්ඩ ඉල්ලීමට පැමිණෙන්නන් තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

06. වෙන්දේසිය සම්බන්ධයෙන් පැමිණිලි කිසිවක් තිබේ නම් වෙන්දේසිය පවත්වන අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු අතර, වෙන්දේසියෙන් පසුව ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

එස්. එම්. එච්. එස්. පී. සේතුංග
මහාධිකරණ විනිසුරු,
සිවිල් අභියාචනා මහාධිකරණය - කළුතර.

2026 ජුනි මස 22 දින,
කළුතර සිවිල් අභියාචනා මහාධිකරණයේ දී ය.

**උපලේඛනය**

| අනු. අංකය | වෙන්දේසි අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය | තක්සේරු වටිනාකම | විකුණුම් මිල |
|---|---|---|---|---|---|
| 01 | 1 | අල්මාරි වානේ | 01 | | |
| 02 | 2 | මේස ලිපිකරු (වානේ) | 01 | | |
| 03 | 3 | පුටු පරිගණක (ඇඳි සහිත) | 02 | | |
| 04 | 4 | පරිගණක (මොනිටර්) | 02 | | |
| 05 | 5 | පරිගණක USP | 03 | | |
| 06 | 6 | පරිගණක (ප්‍රින්ටර්) | 01 | | |
| 07 | 7 | ඡායා පිටපත් යන්ත්‍රය - Xerox (3390552741) | 01 | | |
| 08 | 8 | යතුරු ලියන<br>1. 7674606 සි-ඔලිම්පියා<br>2. 7674670 ඉ - එම<br>3. 7660196 සි - එම<br>4. 565033 ඉ - ෆැසිට් | 04 | | |
| | | එකතුව | | | |
| 09 | 9 | වතුර පිල්ටර් | 01 | | |

08-233

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - කොළඹ**

2027 වර්ෂය සඳහා රා රේන්ද විකිණීම

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද තොටුපළ රේන්ද හා වෙනත් රේන්ද විකිණීමේ කොන්දේසි හා දැනට වලංගුව පවතින සුරාබදු බලපත්‍ර සම්බන්ධ පොදු කොන්දේසි අනුව පැසුණු රා සිල්ලරට පහත දැක්වෙන තැබෑරුම්වල 2027 ජනවාරි 01 දින සිට 2027 දෙසැම්බර් 31 වන දින දක්වා තනි අයිතිය පිට විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර්කරුගේ නමින්ම ඉදිරිපත් කළ යුතුය. යම්කිසි තැබෑරුමක් සඳහා එක් අයෙක් විසින් එක් ටෙන්ඩර් පත්‍රයක් පමණක් ඉදිරිපත් කළ යුතුය. හවුලේ ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍ර සඳහා උපරිම වශයෙන් පස් දෙනෙක් ඇතුළත් විය හැකිය.

03. ටෙන්ඩරය විවෘත කරන දිනට වයස අවුරුදු 21 සම්පූර්ණ වූ පිරිමි ශ්‍රී ලංකා පුරවැසියන් ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීමට සුදුසු වන අතර වගකීම් පැහැරහැරි කොන්ත්‍රාත්කරුවන්ගේ නාමාවලියේ හෝ සුරාබදු බලපත්‍රයක් හෝ රේන්දයක් සම්බන්ධව වගකීම් පැහැරහැරි අයගේ නාමාවලියේ හෝ වෙනත් හේතූන් නිසා කිනම් රේන්දයක් හෝ කොන්ත්‍රාත්තුවක් පිළිබඳ වන කිසිම කටයුත්තකට මැදිහත් වීම තහනම් කරනු ලැබූ අයගේ නාම ලේඛනයේ නම සඳහන් වූ අය මේ සඳහා ටෙන්ඩර් පත්‍රයක් ඉදිරිපත් කිරීමට සුදුසුකම් නොලබයි. තවද, සුරාබදු බලපත්‍රධාරීන් යටතේ රක්ෂාවේ නියුක්ත වීම තහනම් කොට ඇති අයගේ නාමාවලියේ නම සඳහන් වූ හෝ අපරාධ වැළැක්වීමේ ආඥාපනතින් අදහස් කරන ආකාරයේ අපරාධකරුවෙක් වූ හෝ සුරාබදු ආඥාපනතේ 27 වන වගන්තිය යටතේ කවර විටකදී වුවත් බලපත්‍රයක් අවලංගු කරනු ලැබූ හෝ සුරබදු ආඥාපනත යටතේ යම් වරදකට තුන්වරකට වඩා වැඩි වාරයක් වරදකරු කරන ලද හෝ මෙම වරප්‍රසාදය ආරම්භ වීමට කලින් වූ දෙවසර ඇතුළත සුරාබදු ආඥාපනත යටතේ යම් වරදකට වරදකරු කරන ලැබූ යම් තැනැත්තෙකු මේ සඳහා ටෙන්ඩර් පත්‍රයක් ඉදිරිපත් කිරීමට සුදුසුකම් නොලබයි .

04. ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ආකෘතිපත් මාර්ගයෙන් ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ ටෙන්ඩර් තැන්පත් මුදල ලෙස නියම කරන ලද රුපියල් පන්දහසක් ( රු. 5000/= ) තැන්පත් කළ බවට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත් කුවිතාන්සියක් හා ප්‍රාදේශීය ලේකම්වරයෙකුගෙන් ලබාගත් වත්කම් සහතිකයක්ද සමගය. ටෙන්ඩර්කරු ඉදිරිපත් කරන නිශ්චල දේපල පිහිටා තිබෙන කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබා ගන්නා ලද වත්කම් සහතිකයේ මුල් පිටපත ටෙන්ඩරයේ සඳහන් මුදලින් සියයට පහළොවකට ( 15% ) නොඅඩු විය යුතුය. එම සහතිකයන්හි උපලේඛනයන්හි ඇතුළත් එසේම එම සහතික නිකුත් කිරීම සඳහා පදනම් කරගත් කිසිදු දේපළක් විකුණා නැත්නම් එම වත්කම් සහතික නිකුත් කළ දින සිට අවුරුදු 05ක කාලයක් සඳහා වලංගු වේ. රේන්ද කාලය අවසන් වීමට පෙර , වත්කම් සහතිකයක වලංගු කාලය අවසන් වන අවස්ථාවන්හි දී සම්පූර්ණ රේන්ද කාලය සඳහා වලංගු වන අලුත් වත්කම් සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතුය. එසේ නැත්නම් රේන්ද කාලය අවසානය දක්වා ඇති ඉතිරි කාලය සඳහා අතිරේක වත්කම් සහතිකයේ වලංගු කාලය අවසන් වීමට යටත් පිරිසෙන් මසකට පෙර ඉදිරිපත් කළ යුතුය.

තවද වත්කම් සහතිකයේ මුල් පිටපත දිසාපතිවරයෙකු / ප්‍රාදේශීය ලේකම්වරයෙකු විසින් රඳවාගෙන ඇති අවස්ථාවකදී එම නිලධාරියා විසින්ම සහතික කරන ලද පිටපතක් පිළිගත හැකි අතර ටෙන්ඩරය ආවරණය වන පරිදි එහි වත්කම් පැවතිය යුතුය. එක දිස්ත්‍රික්කයක තිබෙන තැබෑරුම් එකකට වැඩි ගණනකට ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් කිරීමට යම් ටෙන්ඩර්කරුවෙකු විසින් කටයුතු කරන විටදී පළමුවෙන්ම ඉදිරිපත් කරන ටෙන්ඩරය සඳහා වත්කම් සහතිකයේ මුල් පිටපත ඇමිණිය යුතු අතර ඉන්පසුව ඉදිරිපත් කරන ටෙන්ඩර් සඳහා වත්කම් සහතිකය ඇමුණූ ටෙන්ඩරයේ විස්තර ටෙන්ඩර් ආකෘති පත්‍රයේ සඳහන් කළ යුතුය. ( මේ සම්බන්ධව කටයුතු කිරීමේදී තොටුපළ රේන්ද හා වෙනත් රේන්ද විකිණීමේ ගැසට් නිවේදනයේ පස්වන (5) ඡේදයේ කරුණු අදාළ වේ.)

05. එක් එක් ටෙන්ඩර්පත සීල් තබන ලද කවරයන්හි බහා කවරයේ වම් පස ඉහළ කෙළවරේ " අංක ......................... දරන රා තැබෑරුම් සඳහා ටෙන්ඩර්පත්‍රය - කොළඹ" යනුවෙන් සඳහන් කර (අ) කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් හෝ (ආ) ලියාපදිංචි තැපෑලෙන් කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත එවීමෙන් හෝ මෙහි පහත සඳහන් රා තැබෑරුම් සඳහා බල පවත්වනු ලබන කොන්දේසි යටතේ දක්වා ඇති වේලාවන් හා දිනයන්හිදී හෝ ඊට පෙර හෝ ලැබෙන්නට සැලැස්විය යුතුය. ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී කාර්යාලයට පැමිණ සිටිය යුතුය.

06. තෝරාගත් ටෙන්ඩර්කරු ඒ මොහොතේම ගැනුම්කරු වශයෙන් දැනුම් දෙනු ලබන අතර, ඉහත පළ කරන ලද රා රේන්ද විකිණීමේ කොන්දේසි ප්‍රකාර , වරප්‍රසාද විකිණීමේ කොන්දේසි අත්සන් කිරීම සඳහා නියම කරනු ලබන මුදලක් තැන්පත් ඇප මුදල වශයෙන් ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවිය යුතුය.

07. සාර්ථක ටෙන්ඩර්කරුට ඔහුගේ ටෙන්ඩර්පත්‍රය පිළිගත් බව දැන් වූ විට රේන්ද විකිණීමේ කොන්දේසි අත්සන් කිරීම හෝ නියම කළ ඇප මුදල් යථා කල්හි තැන්පත් කිරීම හෝ පැහැර හැරියොත් ඔහු විසින් තැන්පත් කරන ලද ටෙන්ඩර් තැන්පත් මුදල අහිමි වන අතර ඔහුගේ නම වරදකරුවෙකු වශයෙන් සුරාබදු බලපත්‍රකරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් කිරීමට පුළුවන. සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලංසුකරු විසින් සම්පූර්ණ මුදල තැන්පත් කර විකිණීමේ කොන්දේසි අඩංගු ගිවිසුම අත්සන් කළ පසු ටෙන්ඩර්කරුවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

08. 2026 වර්ෂය සඳහා දැනට විදේශීය මත්පැන් රේන්දය පවත්වා ගෙන යනු ලබන ස්ථාන 2027 වර්ෂය සඳහා ලබාගත හැකි වේදැයි කිව නොහැක. සාර්ථක ටෙන්ඩර්කරුවන් විසින් අදාළ කොට්ඨාසය තුළින් සුදුසු ගොඩනැගිලි සොයාගත යුතු අතර, එම ගොඩනැගිලි සඳහා සුරාබදු කොමසාරිස්ගේ අනුමැතිය ලබාගත යුතු වේ. ගොඩනැගිලි සපයා දීමට ප්‍රාදේශීය ලේකම් බැඳී නොමැති බැව් සැලකිය යුතුය.

09. ලැබී ඇති සියලුම ටෙන්ඩර්පත්‍රයන් ස්වකීය අභිමතය පරිදි පිළිගැනීමට හෝ ලැබී ඇති සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමේ බලය ප්‍රාදේශීය ලේකම්ට ඇත.

10. මේ සම්බන්ධව කටයුතු කිරීමේදී අංක 207 හා 1982 අගෝස්තු 20 දිනැති ගැසට්පත්‍රයේ පළකරන ලද තොටුපළ රේන්ද විකිණීම යටතේ වූ රා රේන්ද විකිණීමේ කොන්දේසි අදාළ කරගත යුතුය.

අනුමත කරන ලද කොන්දේසි හා ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාග වෙමින් පවතින එෆ්.ආර්.383/2015 දරන මූලික අයිතිවාසිකම් නඩුවට අදාළව නියම කර ඇති කොන්දේසි අනුව අදාළ කර ගත යුතු රා රේන්ද සීමා මායිම් සහිත රා තැබෑරුම් ලැයිස්තුව පහත උපලේඛනයේ දැක්වේ.

උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා බල පවත්වනු ලබන පොදු කොන්දේසි

* තැබෑරුම විවෘත කරන වේලාව පෙ.ව. 10.00 සිට ප.ව. 9.00 දක්වා
* ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල රු. 5000.00 කි
* ටෙන්ඩර්පත් භාරගන්නා අවසන් වේලාව 2026/0924 වන දින පෙ.ව. 10.30 වේ.
* රා තැබෑරුම් විකුණන දිනය 2026/09/24 වන දින පෙ.ව. 10.45 වේ

**උපලේඛනය**

| (ඒ) | (බී) | (සී) |
|---|---|---|
| අනුක්‍රමික අංකය | ප්‍රදේශය | ප්‍රාදේශික ප්‍රදේශය (තැබෑරුමට අයත් විය යුතු පෙදෙස) |
| 01 | අංක 01 කොට්ඨාසය කොටහේන බටහිර (කොටබෝම්) | උතුරට - ස්කිනර් පාරේ දකුණු පෙදෙස සන්දියේ සිට කොටබෝම් වීදියේ සන්දියට සහ ලැස්කිරන් වීදියේ සන්දිය දක්වාත්ය.<br><br>නැගෙනහිරට - ලැස්කිරන් වීදියේ සිට බටහිර පැත්ත ස්කිනර් පාරේ ( දකුණු ) සන්දියේ සිට පෙදෙස හා ජම්පටා වීදිය<br><br>දකුණට - එහි සන්දියේ සිට ජම්පටා වීදියේ උතුරු පෙදෙස කොටබෝම් වීදිය සහ ලැස්කිරන් වීදියේ සන්දිය දක්වා පෙදෙස සහ<br><br>බටහිරට - එකී සන්දියේ සිට කොටබෝම් වීදියේ නැගෙනහිර පෙදෙස ජම්පටා වීදියේ සන්දියේ සිට ස්කිනර් පාර (උතුරට) සන්දිය දක්වා වූ පෙදෙසත්ය. |

| (ඒ) | (බී) | (සී) |
|---|---|---|
| 02 | අංක 02 කොට්ඨාසය කොටහේන (ස්කිනර් පාර) | එම සන්දියේ සිට උතුරු ස්කිනර් පාරේ උතුරු පෙදෙස පිකරින් පාරේ සහ කොටහේන වීදියේ සන්දිය දක්වා වූ පෙදෙස |
| 03 | අංක 03 කොට්ඨාසය මෝදර | (ඒ) ඉහළ වීදියේ ප්‍රදේශය ඇන්ඩෲ පෙදෙසේ සන්දිය දක්වා අලුත් මාවත පාර සහ ශාන්ත ඇන්ඩෲ පාරේ සන්දිය දක්වා,<br>(බී) ශාන්ත ඇන්ඩෲ පාර පෙදෙසේ සන්දිය දක්වා ඉහළ ශාන්ත ඇන්ඩෲ පෙදෙසේ සහ මාෂන් වීදියේ සන්දිය දක්වා,<br><br>(සී) මෝදර වීදියේ ප්‍රදේශ සහ එහි සන්දිය දක්වා , මාෂන් වීදියේ සහ මාදම්පිටිය පාරේ සන්දිය දක්වා,<br>(ඩී) ශාන්ත ජේම්ස් වීදියේ දෙපස එහි සන්දි දක්වා මෝදර වීදියේ සහ අලුත් මාවත පාරේ සන්දිය දක්වා ,<br>(ඊ) අලුත් මාවත පාරේ දෙපස සහ එහි සන්දිය දක්වා , එහි පටුමග සහ පහළ ශාන්ත ඇන්ඩෲ පෙදෙසේ සන්දිය දක්වාත්ය. |
| 04 | අංක 04 කොට්ඨාසය මාදම්පිටිය (ෆර්ගියුෂන් පාර) | උතුරට - ෆර්ගියුෂන් පාර, දකුණු පෙදෙසේ සිට සන්දිය දක්වා සහ මට්ටක්කුලිය පල්ලිය පාරේ ගඟ දක්වා<br><br>නැගෙනහිරට - ලූකස් පාරේ බටහිර පෙදෙසේ සිට සන්දිය දක්වා , ෆර්ගියුෂන් පාරේ සහ මාදම්පිටිය පාරේ සන්දිය දක්වා,<br><br>දකුණට - මාදම්පිටිය පාරේ උතුරු පෙදෙසේ සිට සන්දිය දක්වා, ලූකස් පාර සන්දිය දක්වා.<br><br>බටහිරට - දානියෙල් පාරේ නැගෙනහිර පෙදෙසේ සිට සන්දිය දක්වා මාදම්පිටිය පාරේ සහ හීන මුල්ල පටුමගේ සන්දිය දක්වාත්ය |
| 05 | අංක 05<br><br>කොට්ඨාසය මාදම්පිටිය | උතුරට - ෆර්ගියුෂන් පාරේ දකුණු පෙදෙසේ සිට සන්දිය දක්වා , ලූකස් පාරේ සහ නාගලගම් වීදියේ සන්දිය දක්වා,<br><br>නැගෙනහිරට - නාගලගම් වීදියේ දකුණු පෙදෙසේ සිට සන්දිය දක්වා ,<br>ෆර්ගියුෂන් පාරේ සහ මාදම්පිටිය පාරේ සන්දිය දක්වා,<br><br>දකුණට - මාදම්පිටිය පාරේ උතුරු පෙදෙසේ සිට සන්දිය දක්වා, නාගලගම් වීදියේ සහ ලූකස් පාරේ සන්දිය දක්වා,<br>බටහිර - ලූකස් පාරේ නැගෙනහිර පෙදෙසේ සිට සන්දිය දක්වා , මාදම්පිටිය පාරේ සහ ෆර්ගියුෂන් පාරේ සන්දිය දක්වාත්ය |

11. වැඩි විස්තර කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැක.

12. වැදගත් - 2026/09/24 වැනි දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් රේන්ද 2026/10/22 වැනි දින පෙ.ව. 10.30 ට නැවත විකුණනු ලැබේ.

13. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

සඳරුවන් අනුරුද්ධ
ප්‍රාදේශීය ලේකම්,
කොළඹ.

2026 ජූලි 23 වැනි දින,
කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදීය.

08-248/1

**මීග/ප්‍රා.ලේ./01/11/5/2027**

**මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

2027 වර්ෂය සඳහා රා තැබෑරුම් රා රේන්ද විකිණීම

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ සඳහන් රා රේන්ද විකිණීමේ කොන්දේසි හා දැනට වලංගුව පවතින සුරාබදු බලපත්‍ර සම්බන්ධ පොදු කොන්දේසි අනුව පැසුණු රා සිල්ලරට විකිණීම සඳහා පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් තැබෑරුම්වලට 2027 ජනවාරි මස 01 දින සිට 2027 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා තනි අයිතිය පිට විකිණීම සඳහා ටෙන්ඩර් පත් 2026.09.21 දින පෙ.ව. 10.30 දක්වා මා විසින් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති තැන්පත් මුදල තැන්පත් කළ බවට ලබා ගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය කුවිතාන්සියක් ද, ප්‍රකාශිත රා රේන්ද කොන්දේසි පරිදි ලබා ගත් වත්කම් සහතිකය ද (වත්කම් සහතිකය, ඔබ ඉදිරිපත් කරන ටෙනඩර් වටිනාකමින් 15%කට නොඅඩු විය යුතුය.) ඊට අදාළ ඔප්පුවේ ඡායා පිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් අයදුම්පත මුද්‍රා තබන ලද කවරයක බහා, එහි වම් පස ඉහළ කෙළවරේ "අංක ............. දරන ............................. රා තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් පහත උපලේඛනයේ සඳහන් පරිදි තැබෑරුමේ අංකය සහ නම සඳහන් කොට 2026.09.21 දින පෙ.ව. 10.30ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් එම වේලාවට පෙර මීගමුව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් මීගමුව ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය.

04. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක්ම ටෙන්ඩර්කරුවන් විසින් සම්පූර්ණ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතුය. එසේ නොවන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය වන 2026.09.21 දින පෙ.ව. 10.30ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් මීගමුව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

06. අදාළ හා අත්‍යවශ්‍ය කරුණු සම්පූර්ණ කොට නොමැති ටෙන්ඩර් පත්‍රයක් හෝ ටෙන්ඩර්පත්‍ර සියල්ල ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. පූර්වෝක්ත දින විකණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2026.10.19 වැනි දින පෙ. 10.30ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ දෙවන ඡේදයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය.

08. ටෙන්ඩරය පිරිනමන ලද තැනැත්තා "තනි වරප්‍රසාද මිල දී ගත් තැනැත්තා" යැයි ප්‍රකාශයට පත්කිරීමෙන් අනතුරුව එසේ ප්‍රකාශ කළ දින එනම් රේන්ද විකුණන දින ප.ව. 3.00ට පෙර මා විසින් නියම කරනු ලබන මාසික රේන්ද මුදල මෙන් දෙගුණයකට නොඅඩු මුදලක් ඇප තැන්පත් වශයෙන් මා වෙත ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් කළ යුතුය.

09. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර මීගමුව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි ය.
(දුරකතන අංකය : 031 2224633)

10. මෙම ටෙන්ඩර් විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසාන තීරණය වේ.

රසිකා මල්ලවආරච්චි,
ප්‍රාදේශීය ලේකම් - මීගමුව.

2026 අගෝස්තු මස 10 වැනි දින,
මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

| අනු. අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | තැබෑරුම් අංකය සහ නම | | තැබෑරුම් පිහිටුවිය යුතු කොට්ඨාසය | තැබෑරුම් විවෘතව තැබිය යුතු වේලාව | ටෙන්ඩර් තැන්පත් මුදල රු. | ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය සහ වේලාව |
|---|---|---|---|---|---|---|---|
| 1 | මීගමුව | අංක 10 | සෙත්තපාඩුව | සෙත්තප්පාඩුව ගමේ පමණක් | පෙ.ව. 10.00 සිට ප.ව. 9.00 දක්වා | 5,000/- | 2026.09.21 දින පෙ.ව. 10.30 |
| 2 | | අංක 11 | බසියවත්ත | බසියවත්ත ගමේ පමණක් | | 5,000/- | |
| 3 | | අංක 12 | පිටිපන | පිටිපන ගමේ පමණක් | | 5,000/- | |
| 4 | | අංක 15 | කුරණ | කුරණ ගමේ පමණක් | | 5,000/- | |
| 5 | | අංක 16 | කාමච්චෝඩය | කාමච්චෝඩය ගමේ පමණක් | | 5,000/- | |
| 6 | | අංක 17 | උඩයාර් තෝප්පුව | උඩයාර් තෝප්පුව ගමේ පමණක් | | 5,000/- | |
| 7 | | අංක 18 | කුඩාපාඩුව | කුඩාපාඩුව ගමේ පමණක් | | 1,000/- | |
| 8 | | අංක 19 | දළුපත | දළුපත ගමේ පමණක් | | 5,000/- | |
| 9 | | අංක 20 | පෝරුතොට | පෝරුතොට ගමේ පමණක් | | 3,000/- | |
| 10 | | අංක 21 | කොච්චිකඩේ | කොච්චිකඩේ ගමේ පමණක් | | 3,000/- | |
| 11 | | අංක 22 | පළඟතුරය | පළඟතුරය ගමේ පමණක් | | 1,500/- | |

08-206/1

---

## ජා-ඇල ප්‍රාදේශීය මහ ලේකම් කොට්ඨාසය

### 2027 ජනවාරි මස 01 දින සිට 2027 දෙසැම්බර් මස 31 දින දක්වා කාලය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීම

2027 ජනවාරි මස 01 වැනි දින සිට 2027 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයකටම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උප ලේඛනයෙහි දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල් තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයෙන් යටත් පිරිසෙයින් 15%කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතුය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරෙහි "අංක ....................... දරන ......................... රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් පහත ලේඛනයෙහි සඳහන් පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කොට 2026.09.23 දින පෙ.ව. 10.30ට පෙර ජා ඇල ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් එම වේලාවට පෙර ජා ඇල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින පළ වී ඇති අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ දැක්වෙන රා රේන්ද කොන්දේසි වලට අනුකූල විය යුතුය.

05. 2026.09.23 වැනි දින පෙ.ව. 10.30ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ දී සියලුම ටෙන්ඩර්කරුවන් ජා ඇල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

06. පූර්වොක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2026.10.21 දින පෙ.ව. 10.30ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය.

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර ජා ඇල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.
දුරකතන අංකය : 011 2236428.

එම්. එම්. නිලන්ති කුමාරි,
ප්‍රාදේශීය ලේකම් - ජා ඇල.

මගේ අංකය : ජා/1/7/02/06
2026 අගෝස්තු මස 12 වන දින,
ජා ඇල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ග්‍රාමය* | *ටෙන්ඩර් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* |
|---|---|---|---|---|
| 1 | ජා ඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | කඳාන | 2026.09.23 පෙ.ව. 10.30 | 1,500/- |
| 2 | | වැලිගම්පිටිය | | 1,500/- |
| 3 | | කණුවන | | 4,000/- |
| 4 | | මඩමවත්ත | | 5,000/- |
| 5 | | දඩුගම | | 1,000/- |

08-227

---

**වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

2027 වර්ෂය සඳහා රා තැබෑරුම් විකිණීම

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කර ඇති 1983 වර්ෂයට හා ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා වලංගු රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි වලටත්, එම කාලය තුළ දී පවත්නා සෑම සුරාබදු කොන්දේසියකට යටත්ව, 2027 වර්ෂය තුළ දී පහත දැක්වෙන උපලේඛනයන්හි දැක්වෙන රා තැබෑරුම් වල සිල්ලරට රා විකිණීමේ තනි අයිතිය මිල දී ගැනීම සඳහා වලපනේ ප්‍රාදේශීය ලේකම් විසින් 2026.09.16 දින පෙ.ව. 10.30 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. (අ) සෑම ටෙන්ඩරයක්ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් පෝරමය විය යුතුය.

(ආ) ටෙන්ඩර් මුදලක් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක පහත උපලේඛනයේ දැක්වෙන ආකාර ටෙන්ඩර් මුදලක් තැන්පත් කර නිල කුවිතාන්සියක් ; සහ

(ඇ) ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්වල දේපළ පිහිටි කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබා ගන්නා ලද වත්කම් පිළිබඳ සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම පිළිබඳ යථෝක්ත තැබෑරුම් විකිණීමේ කොන්දේසි වල අඩංගු නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර්කරුවන් වෙත නිවේදනය කෙරේ.

(ඈ) ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී පහත සඳහන් අවශ්‍යතාවයන් කෙරෙහි ද සැලකිලිමත් විය යුතුය.

අ. ටෙන්ඩර් පත්‍ර මුළුමනින්ම සම්පූර්ණ කළ යුතුය. මෙසේ කිරීමේ දී එහි සඳහන් කෙරෙන ගණන ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන්ද ලිවිය යුතුය.

ආ. සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍ර වල නියමිත සාක්ෂිකරුවන්ගේ සාක්ෂි වලට අමතරව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ හැඳුනුම්පත් අංක ද යෙදිය යුතුය.

ඇ. සෑම වෙනස් කිරීමක්/ කපා හැරීමක් ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන සහ දිනය යෙදීමෙන් සහතික කළ යුතුය.

ඈ. සෑම ටෙන්ඩර්කරුවෙකුම ටෙන්ඩර් පෝරමය සමග තම ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද ඡායාපිටපතක් ඉදිරිපත් කළ යුතුය. මෙම නියමයන්ට පටහැනි ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් තැන්පත් මුදල සඳහා ලබා ගන්නා නිල කුවිතාන්සියක්, වත්කම් පිළිබඳ සහතිකයක් සමග ලියුම් කවරයක බහා මුද්‍රා තබා කවරයේ වම් පස ඉහළ කෙළවරේ නියමිත තැබෑරුම් අංකය සහ නම සඳහන් කර වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාරගැනීම අවසන් වීමට පෙර තැන්පත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර තැපෑලෙන් එවන්නේ නම්, ටෙන්ඩර් භාරගැනීමේ වේලාව ඉකුත් වීමට පෙර ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය, වලපනේ යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

04. ටෙන්ඩර් භාර ගැනීමේ අවසන් වේලාව පහත උපලේඛනයේ දැක්වේ. එකී වේලාවට ටෙන්ඩර්කරුවන් වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

05. ඕනෑම ටෙන්ඩරයක් භාරගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය මා සතුය.

06. තෝරාගත් ටෙන්ඩර්කරු, ගැණුම්කරු, ලෙස ප්‍රකාශයට පත් කළ වහාම එදින **ප.ව. 2.00**ට පෙර තැන්පත් මුදල වශයෙන් වලපනේ ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලැබිය හැකි වාරික තුනකට නොඅඩු මුදලක් ඇප තැන්පත් වශයෙන් වලපනේ ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කළ යුතුය. එම මුදල වලපනේ ප්‍රාදේශීය ලේකම් නමින් නිල්දණ්ඩාහින්න මහජන බැංකුවේ වර්ෂයක ස්ථාවර තැන්පත් ගිණුමක රඳවා තැබීමට රේන්දකරුවන් එකඟවිය යුතුය. මෙම තැන්පතුව මුදලින් හෝ බැංකුවක් විසින් ගෙවීම සඳහා ද යන්න සඳහන් කරන ලද චෙක්පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් ආරක්ෂිත චෙක්පත් ස්වරූපයෙන් ගෙවිය යුතුය.

07. අවශ්‍ය මුද්දර ආදිය ඉදිරිපත් කොට කොන්දේසි මාලාවට සහ කොන්ත්‍රාත්තුවට ටෙන්ඩර්කරු අත්සන් තැබිය යුතුය.

08. පොරොන්දු වන ටෙන්ඩර් මුදල වාරික වශයෙන් මුදලින් පමණක් ගෙවිය හැකි අය ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

09. කිසියම් ටෙන්ඩරයක් කිහිප දෙනෙකු විසින් හවුලේ ඉදිරිපත් කරනු ලබන්නේ නම්, ඒ එක් එක් අයවලුන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙන වෙනම පැහැදිලිව දැක්විය යුතුය.

10. මෙම රා තැබෑරුම මෙදින විකුණනු නොලැබුව හොත් 2026.10.15 දින පෙ.ව. 10.30 ට මෙම ස්ථානයේ දීම විකුණනු ලැබේ.

11. මෙම ටෙන්ඩරය විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසාන තීරණය වේ.

12. රේන්ද විකිණීම හා අදාළ කොන්දේසි සහ වෙනත් වැඩි විස්තර වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසා ලබාගත හැකිය.

බී. ඩබ්. ඩබ්. මැණික්සිංහ,
ප්‍රාදේශීය ලේකම් - වලපනේ.

2026 අගෝස්තු මස 17 වන දින,
වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

2027 වර්ෂය සඳහා වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අනුමත කරන ලද රා තැබෑරුම් රේන්ද ලැයිස්තු

| *අංකය හා නම* | *කොට්ඨාසය* | *තැබෑරුම් පිහිටවිය යුතු ස්ථානය* | *තැබෑරුම් විවෘත කර තබන වේලාව* | *ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශත* |
|---|---|---|---|---|---|
| අංක 04 හරස්බැද්ද රා තැබෑරුම් රේන්දය | වලපනේ | හරස්බැද්ද නගරය | පෙ.ව. 10.00 සිට ප.ව. 9.00 දක්වා | 2026.09.16 පෙ.ව. 10.30 | රු. 5,000.00 |
| අංක 05 පදියපැලැල්ල රා තැබෑරුම් රේන්දය | වලපනේ | පදියපැලැල්ල නගරය | පෙ.ව. 10.00 සිට ප.ව. 9.00 දක්වා | 2026.09.16 පෙ.ව. 10.30 | රු. 5,000.00 |

08-281

---

# රජයේ නොවන දැන්වීම්

**ප්‍රසිද්ධ දැන්වීමයි**

**ඩබ්ලිව් ට්‍රේඩ් ඇන්ඩ් එක්ස්පෝර්ට්ස් (පීවීටී)**
**එල්ටීඩී (පීවී 00233138), ඩිසයිනර් පැකේජිං (ප්‍රයිවට්) ලිමිටඩ්**
**(පීවී 00226514) සමග ඒකාබද්ධ කිරීම**
**2007 අංක 07 දරන සමාගම් පනතේ 244(3) වගන්තිය ප්‍රකාරව ප්‍රසිද්ධ දැන්වීම**

2007 අංක 07 දරන සමාගම් පනතේ VII වගන්තියේ ප්‍රතිපාදනයන්ට අනුකූලව ඩබ්ලිව් ට්‍රේඩ් ඇන්ඩ් එක්ස්පෝර්ට්ස් (පීවීටී) එල්ටීඩී (පීවී 00233138), 2007 අංක 7 දරන සමාගම් පනතේ 241 වගන්තිය ප්‍රකාරව/ඩිසයිනර් පැකේජිං (ප්‍රයිවට්) ලිමිටඩ් (පීවී 00226514) සමග ඒකාබද්ධ කළ බව මෙසේ දැනුම් දෙනු ලැබේ.

ඒකාබද්ධ කිරීම අවසන් වූ පසු, ඒකාබද්ධ සමාගම ඩබ්ලිව් ට්‍රේඩ් ඇන්ඩ් එක්ස්පෝර්ට්ස් (පීවීටී) එල්ටීඩී (පීවී 00233138) ලෙස දිගටම පවත්වාගෙන යනු ඇත.

2026 අප්‍රේල් මස 09 වන දින ද අයිලන්ඩ්, දිවයින සහ තිනක්කුරල් පුවත්පත්වල පළකරන ලද යෝජිත ඒකාබද්ධ කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමට සහ 2026 අප්‍රේල් 17 වන දින ශ්‍රී ලංකාවේ නිකුත් කරන ලද *ගැසට්* නිවේදනයට අනුව, ඒකාබද්ධ කිරීම දැන් අවසන් කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඒකාබද්ධ කිරීමේ බලාත්මක දිනය 2026 මැයි මස 20 වන දින වන අතර එය සමාගම් රෙජිස්ට්‍රාර් විසින් නිකුත් කරන ලද ඒකාබද්ධ කිරීමේ සහතිකයේ නිශ්චිතව දක්වා ඇති දිනය වේ.

ලියාපදිංචි කාර්යාලය : අංක 60/1, නිකපේ පාර, දෙහිවල.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි,

රාමනායක මුදියන්සේලාගේ ප්‍රියන්තා,
ජානකී සියඹලාගස්තැන්න,
සමාගම් ලේකම්.

2026 අගෝස්තු මස 11 වැනි දින.

08-259

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(2) වගන්තිය ප්‍රකාරව කරනු ලබන දැනුම් දීමයි.

- සමාගමේ පෙර නාමය : එස්ටීකේ මේන්ටෙනන්ස් (පීවීටී) එල්ටීඩී
- සමාගමේ නව නාමය : එස්ටීකේ රියල්ටි (පීවීටී) එල්ටීඩී
- ලියාපදිංචි අංකය : PV 00292659
- නම වෙනස්කළ සහතිකයේ දිනය : 03.08.2026

අධ්‍යක්ෂක,
ක්‍රෙස්ටන් කෝපරේට් සර්විසස් (පීවීටී) එල්ටීඩී,
සමාගම් ලේකම්වරු.

08-260

---

## ප්‍රසිද්ධ නිවේදනයයි

Sakuvi Invesment Trust (Pvt) Limited (සමාගම් අංක PV 463) සහ Sakuvi Capital (Pvt) Limited (සමාගම් අංක 78208) ඒකාබද්ධ කිරීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 242 (3) b වගන්තිය ප්‍රකාරව සමාගම් අංක PV 463 යටතේ ලියාපදිංචි කරන ලද Sakuvi Investment Trust (Pvt) Limited සහ සමාගම් අංක PV 78208 යටතේ ලියාපදිංචි කරන ලද Sakuvi Capital (Pvt) Limited එම පනතේ 242 වගන්තිය ප්‍රකාරව තනි සමාගමක් ලෙස ඒකාබද්ධ කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඒකාබද්ධ කරන ලද සමාගමේ නම Sakuvi Investment Trust (Pvt) Limited වන බවත්, සමාගම් ලියාපදිංචි කිරීමේ ජෙනරාල් විසින් අනුමත කරන දිනයේ සිට බලපැවැත්වේ.

ඒකාබද්ධ කරන ලද සමාගම වන Sakuvi Investment Trust (Pvt) Limited හි ලියාපදිංචි කාර්යාලය අංක 18/03 කිරිමණ්ඩල මාවත, නාවල, රාජගිරිය යන ලිපිනයෙහි පිහිටා ඇත.

242 (4) වගන්තිය යටතේ ඒකාබද්ධ කිරීම අනුමත කරන යෝජනාව සහ ඒ සමඟ ඉදිරිපත් කර ඇති අනෙකුත් ලේඛන, එකට ගත්විට ඒකාබද්ධ කිරීමේ යෝජනාව ලෙස සලකනු ලබන අතර, ඒවා ඕනෑම කොටස් හිමියකුට, ණයහිමියකුට හෝ ඒකාබද්ධ වන සමාගමේ වගකීමක් යටතේ සිටින ඕනෑම පුද්ගලයකුට පරීක්ෂා කිරීම සඳහා ලබා ගත හැකිය. එම ලේඛන ලේකම්වරුන්ගේ ලියාපදිංචි කාර්යාලය වන අංක 12, රොටුන්ඩා උද්‍යානය, කොළඹ 03 යන ස්ථානයේ දී පරීක්ෂා කළ හැකිය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

Management Application (Pvt) Limited,
ලේකම්වරු,

2026 අගෝස්තු මස 10.
අංක 12,
රොටුන්ඩා උද්‍යානය,
කොළඹ 03

08-282

## දැන්වීමයි

පහත සඳහන් සමාගම 2026 අගෝස්තු මස 03 දින සංස්ථාගත කළ බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

- සමාගමේ නාමය : ගිරින් රුවස් (ප්‍රයිවට්) ලිමිටඩ්
- සමාගමේ ලියාපදිංචි අංකය : පීවී 00369768
- ලියාපදිංචි කාර්යාල ලිපිනය : 97/ඒ, කඩවත පාර, දෙහිවල.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්,
ග්‍රෙගරිස් පාට්නර්ස්,
සාමාගම් ලේකම්වරු.

53/3බී, ග්‍රෙගරි පාර, කොළඹ 07.

08-212

---

## සමාගම් නාමය වෙනස්වීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමයි

- සමාගමේ පැවති නාමය : තන්ත්‍රී ට්‍රේලර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
- සමාගම් අංකය : PV 15532
- ලියාපදිංචි කාර්යාලය : අංක 117, බියගම පාර, කැළණිය.
- සමාගමේ නව නාමය : තන්ත්‍රී (පීවීටී) එල්ටීඩී

සාමාගම් ලේකම්වරු.

08-207/1

---

## සමාගම් නාමය වෙනස්වීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමයි

- සමාගමේ පැවති නාමය : තන්ත්‍රී ට්‍රේලර්ස් ඇන්ඩ් එක්වික්මන්ට් ට්‍රේලර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්ස
- සමාගම් අංකය : PV 12864
- ලියාපදිංචි කාර්යාලය : අංක 117, බියගම පාර, කැළණිය.
- සමාගමේ නව නාමය : තන්ත්‍රී එක්වික්මන්ට් (පීවීටී) එල්ටීඩී

සාමාගම් ලේකම්වරු.

08-207/2

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(2) වගන්තියට අනුව, 2007 අංක 7 දරන සමාගම් පනතේ 8(1) වගන්තියට අනුව පහත සඳහන් පරිදි සිදු කළ බවට කරනු ලබන නිවේදනයයි.

- සමාගමේ කලින් තිබූ නම : කලම්බු ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
- ලියාපදිංචි ලිපිනය : අංක 388/1B, කඩුවෙල පාර, මාලඹේ.
- ලියාපදිංචි සමාගම් අංකය : පීවී 69379
- සමාගමේ නව නාමය : සීඑස්බීඑම් කැම්පස් (පීවීටී) එල්ටීඩී.

කැල්රුප්කෝ මැනේජ්මන්ට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

08-219

**සමාගම් නාමය වෙනස් කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9(2) වගන්තිය යටතේ සමාගම් නාමය වෙනස් කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමයි.

- සමාගමේ පෙර නාමය : ඉන්ටර්නැෂනල් වීසා සර්විසස් (පීවීටී) එල්ටීඩී
- සමාගම් අංකය : PV 84293
- කාර්යාල ලිපිනය : අංක 291/32ඒ, හැව්ලොක් පාර, කොළඹ 06.
- සමාගමේ නව නාමය : අයි.වී.එස්. ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්.

සභාපති,
අයි.වී. එස්. ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්.

අංක 291/32ඒ, හැව්ලොක් පාර, කොළඹ 06.

08-217

---

# රටබීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම්පත්

මිග/ප්‍රා.ලේ./01/11/5/2027

**මීගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

2027 වර්ෂය සඳහා විදෙස් මත්පැන් රේන්දය විකිණීම

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* සඳහන් රා රේන්ද විකිණීමේ කොන්දේසි හා දැනට වලංගුව පවතින සුරාබදු බලපත්‍ර සම්බන්ධ පොදු කොන්දේසි අනුව විදෙස් මත්පැන් විකිණීම සඳහා පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් තැබෑරුම්වලට 2027 ජනවාරි මස 01 දින සිට 2027 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා තනි අයිතියට පිට විකිණීම සඳහා ටෙන්ඩර් පත් 2026.09.21 දින පෙ.ව. 10.30 දක්වා මා විසින් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති තැන්පත් මුදල තැන්පත් කළ බවට ලබා ගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය කුවිතාන්සිය ද, ප්‍රකාශිත රා රේන්ද කොන්දේසි පරිදි ලබා ගත් වත්කම් සහතිකය ද (වත්කම් සහතිකය, ඔබ ඉදිරිපත් කරන ටෙනඩර් වටිනාකමින් 15%කට නොඅඩු විය යුතුය.) ඊට අදාළ ඔප්පුවේ ඡායා පිටපතක් ද සහිතව ඉදිරිපත් කළ යුතුය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් අයදුම්පත මුද්‍රා තබන ලද කවරයක බහා, එහි වම් පස ඉහළ කෙළවරේ "අංක ............ දරන ............................ විදෙස් මත්පැන් හල සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් පහත උපලේඛනයේ සඳහන් පරිදි තැබෑරුමේ අංකය සහ නම සඳහන් කොට 2026.09.21 දින පෙ.ව. 10.30ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එව්ය යුතුය. *නැතහොත්* එම වේලාවට පෙර මීගමුව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් මීගමුව ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය.

04. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක්ම ටෙන්ඩර්කරුවන් විසින් සම්පූර්ණ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතුය. එසේ නොවන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය වන 2026.09.21 දින පෙ.ව. 10.30ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් මීගමුව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

06. අදාළ හා අත්‍යාවශ්‍ය කරුණු සම්පූර්ණ කොට නොමැති ටෙන්ඩර් පත්‍රයක් හෝ ටෙන්ඩර්ු සියල්ල ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. පූර්වෝක්ත දින විකණීමට නොහැකි වූ විදෙස් මත්පැන් හල් නැවත විකිණීම 2026.10.19 වැනි දින පෙ.ව.. 10.30ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් කිරීම මෙම *ගැසට්* නිවේදනයේ දෙවන ඡේදයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය.

08. ටෙන්ඩරය පිරිනමන ලද තැනැත්තා "තනි වරප්‍රසාද මිල දී ගත් තැනැත්තා" යැයි ප්‍රකාශයට පත්කිරීමෙන් අනතුරුව එසේ ප්‍රකාශ කළ දින එනම් රේන්ද විකුණන දින ප.ව. 3.00ට පෙර මා විසින් නියම කරනු ලබන මාසික රේන්ද මුදල මෙන් දෙගුණයකට නොඅඩු මුදලක් ඇප තැන්පත් වශයෙන් මා වෙත ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් කළ යුතු ය.

09. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර මීගමුව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි ය.
දුරකතන අංකය : 031 - 2224633

10. මෙම ටෙන්ඩර් විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසාන තීරණය වේ.

රසිකා මල්ලවආරච්චි,
ප්‍රාදේශීය ලේකම් - මීගමුව.

2026 අගෝස්තු මස 10 වන දින,
මීගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| අනු. අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | තැබෑරුම් අංකය සහ නම | | තැබෑරුම් පිහිටුවිය යුතු කොට්ඨාසය | තැබෑරුම් විවෘතව තැබිය යුතු වේලාව | ටෙන්ඩර් තැන්පත් මුදල රු. | ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය සහ වේලාව |
|---|---|---|---|---|---|---|---|
| 1 | මීගමුව | අංක 02 | ග්‍රීන් බාර් විදෙස් මත්පැන් හල | අංක 08 කොට්ඨාසයේ කුණ්ඩවිල පමණක් | පෙ.ව. 10.00 සිට ප.ව. 9.00 දක්වා | 3,000/- | 2026.09.21 දින පෙ.ව. 10.30 |

08-206/2

---

**ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - කොළඹ**

2027 වර්ෂය සඳහා රටබීම තැබෑරුම් රේන්ද විකිණීම

රජයෙන් අනුමත කරන ලද පහත සඳහන් එක් එක් ප්‍රාදේශීක ප්‍රදේශයන්හි සුදුසු ස්ථානයක 2027 ජනවාරි මස 01 වන දින සිට 2027 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා තනි අයිතිය පිට පහත සඳහන් කොන්දේසි වලට යටත්ව රටබීම (මෙරට සාදන ධාන්‍ය මත්පැන් ඇතුළුව) විකිණීම සඳහා ටෙන්ඩර්පත්‍ර භාරගනු ලැබේ.

- 1982.08.20 වැනි දින හා අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත රටබීම තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි
- සුරාබදු බලපත්‍ර සම්බන්ධව දැනට පවතින පොදු කොන්දේසි

02. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර්කරුගේ නමින්ම ඉදිරිපත් කළ යුතුය. යම්කිසි තැබෑරුමක් සඳහා එක් අයෙක් විසින් එක් ටෙන්ඩර් පත්‍රයක් පමණක් ඉදිරිපත් කළ යුතුය. හවුලේ ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍ර සඳහා උපරිම වශයෙන් පස් දෙනෙක් ඇතුළත් විය හැකි ය.

03. ටෙන්ඩරය විවෘත කරන දිනට වයස අවුරුදු 21 සම්පූර්ණ වූ පිරිමි ශ්‍රී ලංකා පුරවැසියන් ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීමට සුදුසු වන අතර වගකීම් පැහැරහැරි කොන්ත්‍රාත්කරුවන්ගේ නාමාවලියේ හෝ සුරාබදු බලපත්‍රයක් හෝ රේන්දයක් සම්බන්ධව වගකීම් පැහැරහැරි අයගේ නාමාවලියේ හෝ වෙනත් හේතූන් නිසා කිනම් රේන්දයක් හෝ කොන්ත්‍රාත්තුවක් පිළිබඳ වන කිසිම කටයුත්තකට මැදිහත් වීම තහනම් කරනු ලැබූ අයගේ නාම ලේඛනයේ නම සඳහන් වූ අය මේ සඳහා ටෙන්ඩර් පත්‍රයක් ඉදිරිපත් කිරීමට සුදුසුකම් නොලබයි. තවද, සුරාබදු බලපත්‍රධාරීන් යටතේ රක්ෂාවේ නියුක්ත වීම තහනම් කොට ඇති අයගේ නාමාවලියේ නම සඳහන් වූ හෝ අපරාධ වැළැක්වීමේ ආඥාපනතින් අදහස් කරන ආකාරයේ අපරාධකරුවෙක් වූ හෝ සුරාබදු ආඥාපනතේ 27 වන වගන්තිය යටතේ

කවර විටකදී වුවත් බලපත්‍රයක් අවලංගු කරනු ලැබූ හෝ සුරාබදු ආඥාපනත යටතේ යම් වරදකට තුන්වරකට වඩා වැඩි වාරයක් වරදකරු කරන ලද හෝ මෙම වරප්‍රසාදය ආරම්භ වීමට කලින් වූ දෙවසර ඇතුළත සුරාබදු ආඥාපනත යටතේ යම් වරදකට වරදකරු කරන ලැබූ යම් තැනැත්තකු මේ සඳහා ටෙන්ඩර් පත්‍රයක් ඉදිරිපත් කිරීමට සුදුසුකම් නොලබයි .

04. ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ආකෘතිපත් මාර්ගයෙන් ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ ටෙන්ඩර් තැන්පත් මුදල ලෙස නියම කරන ලද රුපියල් පන්දහසක් ( රු. 5000/= ) තැන්පත් කළ බවට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත් කුවිතාන්සියක් හා ප්‍රාදේශීය ලේකම්වරයකුගෙන් ලබාගත් වත්කම් සහතිකයක්ද සමගය. ටෙන්ඩර්කරු ඉදිරිපත් කරන නිශ්චල දේපළ පිහිටා තිබෙන කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබා ගන්නා ලද වත්කම් සහතිකයේ මුල් පිටපත ටෙන්ඩරයේ සඳහන් මුදලින් සියයට පහළොවකට ( 15% ) නොඅඩු විය යුතුය. එම සහතිකයන්හි උපලේඛනයන්හි ඇතුළත් එසේම එම සහතික නිකුත් කිරීම සඳහා පදනම් කරගත් කිසිදු දේපළක් විකුණා නැත්නම් එම වත්කම් සහතික නිකුත් කළ දින සිට අවුරුදු 05ක කාලයක් සඳහා වලංගු වේ. රේන්ද කාලය අවසන් වීමට පෙර , වත්කම් සහතිකයක වලංගු කාලය අවසන් වන අවස්ථාවන් හි දී සම්පූර්ණ රේන්ද කාලය සඳහා වලංගු වන අලුත් වත්කම් සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතු ය. එසේ නැත්නම් රේන්ද කාලය අවසානය දක්වා ඇති ඉතිරි කාලය සඳහා අතිරේක වත්කම් සහතිකයේ වලංගු කාලය අවසන් වීමට යටත් පිරිසෙන් මසකට පෙර ඉදිරිපත් කළ යුතු ය ;

තව ද වත්කම් සහතිකයේ මුල් පිටපත දිසාපතිවරයකු / ප්‍රාදේශීය ලේකම්වරයකු විසින් රඳවාගෙන ඇති අවස්ථාවකදී එම නිලධාරියා විසින්ම සහතික කරන ලද පිටපතක් පිළිගත හැකි අතර ටෙන්ඩරය ආවරණය වන පරිදි එහි වත්කම් පැවතිය යුතුය. එක දිස්ත්‍රික්කයක තිබෙන තැබෑරුම් එකකට වැඩි ගණනකට ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් කිරීමට යම් ටෙන්ඩර්කරුවෙකු විසින් කටයුතු කරන විටදී පළමුවෙන්ම ඉදිරිපත් කරන ටෙන්ඩරය සඳහා වත්කම් සහතිකයේ මුල් පිටපත ඇමිණිය යුතු අතර ඉන්පසුව ඉදිරිපත් කරන ටෙන්ඩර් සඳහා වත්කම් සහතිකය ඇමුණූ ටෙන්ඩරයේ විස්තර ටෙන්ඩර් ආකෘති පත්‍රයේ සඳහන් කළ යුතු ය. ( මේ සම්බන්ධව කටයුතු කිරීමේදී රටබීම තැබෑරුම් රේන්ද විකිණීමේ *ගැසට්* නිවේදනයේ පස්වන (5) ඡේදයේ කරුණු අදාළ වේ.)

05. කවරයක බහා මුද්‍රා තබන ලද එක් එක් ටෙන්ඩර්පත්‍රය ඇතුළත් කවරයෙහි උඩ වම් කෙළවරේ "20....... වර්ෂයේ කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක ............. දරන රට බීම තැබෑරුම සඳහා ටෙන්ඩර්පත්‍රය" යි යන්න සඳහන් ටෙන්ඩර් පත්‍ර 2026.09.24 වන දින පෙ.ව. 10.30ට පෙර ලැබෙන දේ කොළඹ ප්‍රාදේශීය ලේකම් වෙත එවිය යුතුය. ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් විවෘත කරන ලද වේලාවේ දී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමිණිය යුතුයි.

06. තෝරා ගත් ටෙන්ඩර්කරු ඒ මොහොතේම ගැනුම්කරු වශයෙන් දැනුම් දෙනු ලබන අතර, ඉහත පළ කරන ලද රටබීම රේන්ද විකිණීමේ කොන්දේසි ප්‍රකාර , වරප්‍රසාද විකිණීමේ කොන්දේසි අත්සන් කිරීම සඳහා නියම කරනු ලබන මුදලක් තැන්පත් ඇප මුදල වශයෙන් ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවිය යුතු ය.

07. සාර්ථක ටෙන්ඩර්කරුට ඔහුගේ ටෙන්ඩර්පත්‍රය පිළිගත් බව දැන් වූ විට රේන්ද විකිණීමේ කොන්දේසි අත්සන් කිරීම හෝ නියම කළ ඇප මුදල් යථා කල්හි තැන්පත් කිරීම හෝ පැහැර හැරියොත් ඔහු විසින් තැන්පත් කරන ලද ටෙන්ඩර් තැන්පත් මුදල අහිමි වන අතර, ඔහුගේ නම වරදකරුවකු වශයෙන් සුරාබදු බලපත්‍රකරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් කිරීමට පුළුවන. සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලංසුකරු විසින් සම්පූර්ණ මුදල තැන්පත් කර විකිණීමේ කොන්දේසි අඩංගු ගිවිසුම අත්සන් කළ පසු ටෙන්ඩර්කරුවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

08. ලැබී ඇති සියලුම ටෙන්ඩර්පත්‍රයන් ස්වකීය අභිමතය පරිදි පිළිගැනීමට හෝ ලැබී ඇති සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමේ බලය ප්‍රාදේශීය ලේකම්ට ඇත.

09. 2026 වර්ෂය සඳහා දැනට විදේශීය මත්පැන් රේන්දය පවත්වා ගෙන යනු ලබන ස්ථාන 2027 වර්ෂය සඳහා ලබාගත හැකි වේදැයි කිව නොහැක. සාර්ථක ටෙන්ඩර්කරුවන් විසින් අදාළ කොට්ඨාසය තුළින් සුදුසු ගොඩනැගිලි සොයාගත යුතු අතර, එම ගොඩනැගිලි සඳහා සුරාබදු කොමසාරිස්ගේ අනුමැතිය ලබාගත යුතු වේ. ගොඩනැගිලි සපයා දීමට ප්‍රාදේශීය ලේකම් බැඳී නොමැති බැව් සැලකිය යුතුය.

10. මේ සම්බන්ධව කටයුතු කිරීමේදී අංක 207 හා 1982 අගෝස්තු 20 දිනැති *ගැසට්පත්‍රයේ* පළකරන ලද තොටුපළ රේන්ද හා වෙනත් රේන්ද විකිණීම යටතේ වූ විදේශීය මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි අදාළ කරගත යුතු ය.

අනුමත කරන ලද කොන්දේසි හා ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාග වෙමින් පවතින එෆ්.ආර්.383/2015 දරන මූලික අයිතිවාසිකම් නඩුවට අදාළව නියම කර ඇති කොන්දේසි අනුව අදාළ කර ගත යුතු රා රේන්ද සීමා මායිම් සහිත රා තැබෑරුම් ලැයිස්තුව පහත උපලේඛනයේ දැක්වේ :-

උපලේඛනයේ සඳහන් රටබීම තැබෑරුම් සඳහා බල පවත්වනු ලබන පොදු කොන්දේසි ;

* තැබෑරුම විවෘත කරන වේලාව පෙ.ව. 10.00 සිට ප.ව. 9.00 දක්වා :
* ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල රු. 5,000.00 කි :
* ටෙන්ඩර්පත් භාරගන්නා අවසන් වේලාව 2026/09/24 වන දින පෙ.ව. 10.30 වේ :
* රා තැබෑරුම් විකුණන දිනය 2026/09/24 වන දින පෙ.ව. 10.45 වේ.

උපලේඛනය

| *(ඒ)* | *(බී)* | *(සී)* |
|---|---|---|
| *අනුක්‍රමික අංකය* | *ප්‍රදේශය* | *ප්‍රාදේශික ප්‍රදේශය (තැබෑරුමට අයත් විය යුතු පෙදෙස)* |
| 01 | අංක 01 කොට්ඨාසය කොටුව | උතුරට - ජනාධිපති මාවතේ මධ්‍ය රේඛාව හා ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ නැගෙනහිර දිශාවට ගිය විට යෝර්ක් වීදියේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට යෝර්ක් වීදියේ මධ්‍ය රේඛාව ඔස්සේ උතුරු දිශාවට ගිය විට පල්ලිය වීදියේ මධ්‍ය රේඛාව හා ලේඩන් බැස්ටියන් මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට ලේඩන් බැස්ටියන් මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ නැගෙනහිර දිශාවට ගිය විට ලෝටස් පාරේ මධ්‍ය රේඛාව හා ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට නැගෙනහිර දිශාවට ගිය විට එන්.එච්.එම්. අබ්දුල් කාදර් මාවතේ මධ්‍ය රේඛාව හා කෙලින් වීදියේ මධ්‍ය රේඛාව හමුවන බාන් ඔරලෝසු කණුව පිහිටි සන්දියේ මධ්‍ය ලක්ෂයේ සිට එන්.එච්.එම් අබ්දුල් කාදර් මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ නැගෙනහිර දිශාවට ගියවිට දෙවන හරස් වීදියේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂය දක්වාද<br><br>නැගෙනහිරට - එන්.එච්.එම් අබ්දුල් කාදර් මාවතේ මධ්‍ය රේඛාව හා දෙවන හරස් වීදියේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට දෙවන හරස් වීදියේ මධ්‍ය රේඛාව ඔස්සේ දකුණු දිශාවට ගිය විට ඕල්කට් මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂය දක්වාද<br><br>දකුණට - දෙවන හරස් වීදියේ මධ්‍ය රේඛාව හා ඕල්කට් මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට ඕල්කට් මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ බටහිර දිශාවට ගිය විට ලෝටස් පාරේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට ලෝටස් පාරේ මධ්‍ය රේඛාවේ ඔස්සේ දකුණු දිශාවට ගියවිට යෝර්ක් වීදියේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට යෝර්ක් වීදියේ මධ්‍ය රේඛාව ඔස්සේ බටහිර දිශාවට ගිය විට ලංකා බැංකු මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට ලංකා බැංකු මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ බටහිර දිශාවට ගිය විට ජනාධිපති මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂය දක්වාද |

| *(ඒ)* | *(බී)* | *(සී)* |
|---|---|---|
| *අනුක්‍රමික අංකය* | *ප්‍රදේශය* | *ප්‍රාදේශික ප්‍රදේශය (තැබෑරුමට අයත් විය යුතු පෙදෙස)* |
| 01 | අංක 01 කොට්ඨාසය කොටුව | බටහිරට - ලංකා බැංකු මාවතේ මධ්‍ය රේඛාව ජනාධිපති මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට ජනාධිපති මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ උතුරු දිශාවට ගිය විට ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂය දක්වාද වේ. |
| 02 | අංක 02 කොට්ඨාසය මෝදර | උතුරට : පහල ශාන්ත ඇන්ඩෲ පාරේ මධ්‍ය රේඛාව හා ශාන්ත ඇන්ඩෲ පාරේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට ශාන්ත ඇන්ඩෲ පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ උතුරු දිශාවට ගිය විට ඩිලාසල් වීදියේ මධ්‍ය රේඛාව හා මුතුවැල්ල මාවතේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට මුතුවැල්ල මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ උතුරු දිශාවට ගියවිට මෝදර වීදියේ මධ්‍ය රේඛාව හා මාදම්පිටිය පාරේ මධ්‍ය රේඛාව හමුවන කෝවිල සන්දියේ පිහිටි මධ්‍ය ලක්ෂයේ සිට මෝදර වීදියේ මධ්‍ය රේඛාව ඔස්සේ උතුරු දිශාවට ගිය විට විස්ට්වයික් පාරේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂය දක්වාද<br><br>නැගෙනහිරට : මෝදර වීදියේ මධ්‍ය රේඛාව හා විස්ට්වයික් පාරේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට මෝදර පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ නැගෙනහිර දිශාවට ගියවිට අළුත්මාවත පාරේ මධ්‍ය රේඛාව හමුවන රාස්සමුල්ල කන්ද හතරමං හන්දිය පිහිටි මධ්‍ය ලක්ෂය දක්වාද<br><br>දකුණ - මෝදර වීදියේ මධ්‍ය රේඛාව හා අළුත් මාවත පාරේ මධ්‍ය රේඛාව හමුවන රාස්සමුල්ල කන්ද හතරමං හන්දිය පිහිටි මධ්‍ය ලක්ෂයේ සිට අළුත් මාවත පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ දකුණු දිශාවට ගිය විට පහල ශාන්ත ඇන්ඩෲ පාරේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂය දක්වා ද<br><br>බටහිරට - අළුත් මාවත පාරේ මධ්‍ය රේඛාව හා පහල ශාන්ත ඇන්ඩෲ පාරේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂයේ සිට පහළ ශාන්ත ඇන්ඩෲ පාරේ මධ්‍ය රේඛාව ඔස්සේ බටහිර දිශාවට ගියවිට ශාන්ත ඇන්ඩෲ පාරේ මධ්‍ය රේඛාව හමුවන මධ්‍ය ලක්ෂය දක්වා ද වේ. |

11. වැඩි විස්තර කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැක.

12. වැදගත් - 2026/09/24 වැනි දින විකිණීමට නොහැකි වූ රටබීම මත්පැන් තැබෑරුම් රේන්ද 2026/10/22 වැනි දින පෙ.ව. 10.30 ට නැවත විකුණනු ලැබේ.

13. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

සඳරුවන් අනුරුද්ධ
ප්‍රාදේශීය ලේකම්,
කොළඹ.

2026/07/23 වැනි දින,
කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදීය.

08-248/2

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ඩබ්ලිව්. එස්. හෙට්ටිආරච්චි
ගිණුම් අංක : 1063 5700 0097.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර, 2026.01.28 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් එක් කෝටි හැත්තෑ හත් ලක්ෂ එක් දහස් පන්සිය අනූ තුනයි ශත හැත්තෑ හතරක (රු.17,701,593.74) මුදල ද, 2025 නොවැම්බර් මස 21 දින සිට අංක 687 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක් කෝටි හැට හය ලක්ෂ අසූ තුන් දහස් අනූ තුනයි ශත හැත්තෑ හතක (රු. 16,683,093.77) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දොළහයි දශම පහයි බිංදුවක් (12.50%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වේතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2026.02.27 දින *රජයේ ගැසට් පත්‍රයේ* 2026.02.20 දින දිවයින සහ තිනකුරල් සහ අයිලන්ඩ් දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළ කොට ඇති පරිදි,

**2026.10.14 දින ප.ව. 1.30 ට**

පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන ඩී. ජී. සී. ප්‍රියදර්ශනී යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල මහ නගර සභා සීමාවන් තුළ සහ කඩුවෙල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, වික්‍රමසිංහපුර අංක 479 C දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ තලංගම දකුණ පිහිටි පන්නිපිටිය පාර, වරිපනම් අංක 639/51 දරන "බටදෙණිය" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඒ. හෙට්ටිගේ විසින් සාදන ලද 2001 නොවැම්බර් මස 10 දාතම හා අංක 3205 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 37 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්: උතුරට : ලොට් 58 (ඇළ සඳහා වෙන් කිරීම); නැගෙනහිරට : අගල; දකුණට : ලොට් 51 (පාර); බස්නාහිරට : ලොට් 38 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දොළහයි දශම දෙකයි පහක් (පර්. 12.25) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සැම සියලු දේ සමග අංක 3205 දරන එකී පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව B 1496/31 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බලයලත් මානක තැන දේවසුරේන්ද්‍ර විසින් සාදන ලද 1996 සැප්තැම්බර් මස 10 දාතම හා අංක 304 දරන පිඹුරේ ලොට් 4 සහ බලයලත් මානක තැන එන්. හේරත් විසින් සාදන ලද 2004 ජනවාරි මස 21 දාතම හා අංක 2004/23 A දරන පිඹුරේ ලොට් R1 සහ ලොට් R2 සහ අංක 3205 දරන එකී පිඹුරේ නිරූපිත ලොට් 51 (අඩි 20 පළල පාර සඳහා වෙන් කිරීම), ලොට් 53 (අඩි 12 පළල පාර සඳහා වෙන්කිරීම) සහ ලොට් 50R2 (අඩි 30 පළල පාර සඳහා වෙන් කිරීම) වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටස් දිගේ හා ඒ මතින් ඒ යටින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමඟය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

08-268

---

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

එල් එච් පී පයිලිං (ප්‍රයිවට්) ලිමිටඩ්
ගිණුම් අංක : 0082 1000 2066.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර, 2025.09.24 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් විසි නව කෝටි එක් ලක්ෂ හාර දහස් නවසිය අසූ පහයි ශත දහ අටක (රු. 290,104,985.18) මුදල ද, 2025 සැප්තැම්බර් මස 12 දින සිට අංක SBL/MM/2017/02 දරන යන්ත්‍රසූත්‍ර උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දෙකෝටි දස ලක්ෂ හැට හත් දහස් හයසිය හැත්තෑ හතරයි ශත තිස් එකක (රු. 21,067,674.31) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළොවයි දශම පහයි බිංදුවක් (15.50%), රුපියල්

පනස් හය ලක්ෂ තිස් අට දහස් හයසිය අසූ එකයි ශත තිස් එකක (රු. 5,638,681.31) මුදලක් සඳහා at the rate of Monthly Average Weighted Prime Lending Rate + One decimal Five Naught per centum (AWPLR + 1.5%) per annum, රුපියල් දෙකෝටි පනස් ලක්ෂ විසි අට දහසක (රු. 25,028,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට හයක් (6%) හා තවත් රුපියල් පහළොස් කෝටි අසූ හතර ලක්ෂ පනස් හය දහස් හයසිය හැට තුනයි ශත අසූ හතක (රු. 158,456,663.87) මුදලක් සඳහා at the rate of Monthly Average Weighted Prime Lending Rate + One decimal Five Naught per centum (AWPLR + 1.5%) per annum බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වේනොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2026.05.15 දින *රජයේ ගැසට් පත්‍රයේ* 2026.02.03 දින දිවයින සහ තිනකුරල් සහ අයිලන්ඩ් දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළ කොට ඇති පරිදි,

**2026.10.07 දින ප.ව. 2.30 ට**

පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කය තුළ කොළඹ 05, නාරාහේන්පිට නාවල පාර, අංක 151 එල් එච් පී පයිලිං (ප්‍රයිවට්) ලිමිටඩ් පරිශ්‍රයන් හි මත තබනු ලබන හෝ වෙනත් ඕනෑම ස්ථානයකට හෝ ස්ථානවලට ඒවා ඉවත් කරගෙන ගෙනයනු ලැබිය හැකි සහ ගබඩා කොට තැබිය හැකි හෝ ස්ථාපිත කොට තැබිය හැකි මෙහි මින්මතු මැනවින් විස්තර කොට ඇති සියලුම හා එක් එක් චංචල යන්ත්‍රාගාර යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ.

Baur BG26/BT 70D Piling Machine
Machine No. CXG00935E 001H0005 Engine No. J80GNG30171

එකී පරිශ්‍රයන් වෙත ගෙන එනු ලබන සහ ස්ථාපිත කරනු ලබන චංචල යන්ත්‍රසූත්‍ර සහ එකී යන්ත්‍රසූත්‍ර සහ උපකරණ හෝ එහි ඕනෑම කොටසක් හෝ සමූහයක් වෙනුවට කලින් කලට ගෙන එනු ලබන චංචල යන්ත්‍රසූත්‍ර.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

08-270

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

එල්. එච්. පියසේන ඇන්ඩ් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ්.
ගිණුම් අංකය : 0082 1000 0616

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර, 2025.09.24 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් හය කෝටි අනූ තුන් ලක්ෂ අසූ පන් දහස් හත්සිය හතළිස් හයයි ශත හැත්තෑ එකක (රු. 69,385,746.71) මුදල ද, 2025 ජූලි මස 30 වැනි දින සිට අංක 1155 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් තුන් කෝටි හැට ලක්ෂ හතළිස් පන් දහස් අටසිය එකොළහයි ශත පනස් තුනක (රු. 36,045,811.53) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළොවයි දශම පහක් (15.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වේනොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2026.05.15 දින *රජයේ ගැසට් පත්‍රයේ* 2026.02.10 දින දිවයින සහ තිනකුරල් සහ අයිලන්ඩ් දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළ කොට ඇති පරිදි,

**2026.10.07 දින පෙ.ව. 11.00 ට සහ පෙ.ව. 11.12 ට,**

පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

1. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, නැගෙනහිර රයිගම් කෝරළේ, උඩුගහ පත්තුවේ, හොරණ ප්‍රාදේශීය සභා සීමාවන් තුළ ඉංගිරිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, කැකුලදොල, අංක 624A දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ කැකුලදොල ග්‍රාමයේ පිහිටි "කෙන්දගොල්ල ගෘෘප්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එම්. පී. ආර්. ආනන්ද විසින් සාදන ලද 2015 සැප්තැම්බර් මස 01 දාතම හා අංක 1356/2015 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්

කොට ලොට් 1B වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : ලොට් 1C සහ පී. එදිරිසිංහ සහ වෙනත් අය විසින් හිමිකම් කියන ඉඩම; නැගෙනහිරට: පෝරුවදණ්ඩ සිට හඳපාන්ගොඩ දක්වා පාර; දකුණට: පෝරුවදණ්ඩ සිට හඳපාන්ගොඩ දක්වා පාරට දිවෙන හඳපාන්ගොඩ සිට පාර සහ බස්නාහිරට : ලොට් 1C යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර දහයයි රූඩ් දෙකයි පර්චස් තිස් හතරයි දශම හයක් (A:10, R:2, P:34.6) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 1356/2015 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රුරුව M 62/02 යටතේ හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

2. එකී කැකුලදොල ග්‍රාමයේ පිහිටි "කෙන්දගොල්ල ගෘෘප්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එම්. පී. ආර්. ආනන්ද විසින් සාදන ලද 2015 සැප්තැම්බර් මස 01 දාතම හා අංක 1356/2015 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් 1E වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : පෝරුවදණ්ඩ සිට හඳපාන්ගොඩ දක්වා පාරට දිවෙන හඳපාන්ගොඩ සිට පාර; නැගෙනහිරට : ජී. වැලිකල විසින් හිමිකම් කියන ඉඩම; දකුණට : ජී. වැලිකල සහ වෙනත් අය විසින් හිමිකම් කියන ඉඩම සහ බස්නාහිරට : ලොට් 1D යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර එකයි පර්චස් විස්සක් (A:1, R:0, P:20.0) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 1356/2015 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රුරුව M 62/04 යටතේ හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

08-271

---

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

1. ඉසුරු එන්ටර්ප්‍රයිසස් - ගිණුම් අංකය : 0162 1000 0031
2. මංජිත කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් ඉන්ජිනියර්ස් - ගිණුම් අංකය : 0162 1000 1712

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර, 2026.06.25 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් අනුව රුපියල් පහළොස් කෝටි විසි තුන් ලක්ෂ හතළිස් හත් දහස් තුන්සිය හැත්තෑ හතරයි ශත හැත්තෑ හතරක (රු. 152,347,374.74) මුදල ද, 2025 අප්‍රේල් මස 07 දින සිට අංක 5570, 970, 540, 2752, 1613, 542 සහ 2754 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක් රුපියල් දෙකෝටියක (රු. 20,000,000.00) මුදලක් සඳහා වාර්ෂිකව at the rate of Average Weighted Prime Lending Rate+ Two Decimal Naught per centum (AWPLR+2.0% p.a.) per annum හා තවත් රුපියල් හය කෝටි අනූ තුන් ලක්ෂ හතළිස් අට දහස් දෙසීයක (රු. 69,348,200.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළොවයි දශම පහයි බිංදුවක් (15.50%) per annum for the first twelve months and thereafter Average Prime Lending Rate + Two Decimal Naught per centum (AWPLR + 2.0% p.a.) per annum හා තවත් රුපියල් එක්කෝටි විසි නව ලක්ෂ අනූ නව දහස් එකසිය පනස් අටයි ශත අසූ එකක (රු. 12,999,158.81) මුදලක් සඳහා වාර්ෂිකව at the rate of Average Prime Lending Rate + Two Decimal Naught per centum (AWPLR + 2.0% p.a.) per annum හා තවත් රුපියල් දෙකෝටි හැට ලක්ෂයක (රු. 26,000,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට තිහයි දශම බිංදුවක් (30.0%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වේතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2026.02.20 දින *රජයේ ගැසට් පත්‍රයේ* 2026.02.25 දින දිවයින සහ තිනකුරල් සහ අයිලන්ඩ් දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළ කොට ඇති පරිදි,

**2026.10.06 දින උපලේඛනය 01 ප.ව. 1.30 ට**

**2026.10.06 දින උපලේඛනය 02 ප.ව. 2.30 ට**

පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ කඩුවෙල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ අංක 473A දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කොතලාවල පිහිටි කොළඹ පාර, වරිපනම් අංක 126, 126/1, 128 දරන "කුරුගහකැලේ " යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන, ඒ. කේ. මාතරාච්චි

විසින් සාදන ලද 2010 සැප්තැම්බර් මස 23 දාතම හා අංක 1010 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් A වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : කැලණි ගඟ සමග ගඟ දිගේ වෙන්කිරීම; නැගෙනහිරට: මෙම ඉඩමේ ලොට් B2; දකුණට : මෙම ඉඩමේ ලොට් B2 සහ පාර සහ බස්නාහිරට: මිය ගිය හැරී ඩයස් විසින් හිමිකම් කියන රජ්ජුරුවන්ගේ වත්ත යන මායිම් තුළ පිහිටි රූඩ් දෙකයි පර්චස් දහ නවයක් (රූඩ්. 02, පර්. 19) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 1010 දරන පිඹුරට අනුව වෙළුම / පත් ඉරුව B 697/92 යටතේ කඩුවෙල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 970, 540, 2752 සහ 5570 මගින් හා ඒ යටතේ උකස්කොට ඇපකොට ඇත.)

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල මහ නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, බත්තරමුල්ල, උතුර අංක 492B දරන ග්‍රාම නිළධාරි කොට්ඨාසයේ, බත්තරමුල්ල පිහිටි පන්නිපිටිය පාර, වරිපනම් අංක 77/34/4/1 දරන "ලොකුආරච්චිගේ කුරුඳුවත්ත සහ මුර්ගු මුහන්දිරන්ගේ කුරුඳුවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එම්. එල්. එන්. පෙරේරා විසින් සාදන ලද 2004 මැයි මස 05 දාතම හා අංක 2569 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් A වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට: ප්‍රාදේශීය සභා පාර; නැගෙනහිරට : පන්නිපිටිය පාර, වරිපනම් අංක 77/33 දරන පරිශ්‍රයන්; දකුණට : පන්නිපිටිය පාර, වරිපනම් අංක 85/1 දරන පරිශ්‍රයන් සහ බස්නාහිරට : පන්නිපිටිය පාර, වරිපනම් අංක 81 සහ 79 දරන පරිශ්‍රයන් යන මායිම් තුළ පිහිටි පර්චස් විසි එකයි දශම තුනයි හතක් (පර්. 21.37) විශාල ඉඩම් කොටස, පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 2569 දරන පිඹුරට අනුවය.

එකී ලොට් A පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි:

එකී බත්තරමුල්ල පිහිටි "ලොකුආරච්චිගේ කුරුඳුවත්ත සහ මුර්ගු මුහන්දිරන්ගේ කුරුඳුවත්ත " යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ජී. ඩබ්ලිව්. ප්‍රනාන්දු විසින් සාදන ලද 1961 ඔක්තෝබර් මස 01 දාතම හා අංක 485 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් C13B වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්: උතුරට : කරත්ත පාර; නැගෙනහිරට: කේ. සී. පෙරේරාගේ දේපළ; දකුණට එස්. ඩබ්ලිව්. එෆ්. ඩී. බණ්ඩාරනායකගේ දේපළ සහ බස්නාහිරට : ලොට් C13A යන මායිම් තුළ පිහිටි පර්චස් විසි එකයි දශම තුනයි හතක් (පර්. 21.37) විශාල ඉඩම් කොටස සමග එකී අංක 485 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව B 1446/04 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බලයත් මානක තැන එම්. බී. ද සිල්වා විසින් සාදන ලද 1949 අප්‍රේල් මස 07 දාතම හා අංක 6872 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන් කොට ලොට් C20 දිගේ හා ඒ මගින් ඒ යටින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සහ ඒ හා බැඳුණ වෙනත් අයිතීන් ද සමඟය.

(උකස් බැඳුම්කර අංක 1613, 542 සහ 2754 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

08-272

---

**පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී.එල්.සී.**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වගන්තිය යටතේ දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන සහාධිපත්‍ය ඒකකයන් එකී ඒකකයන් පිහිටි ස්ථානයේ දී පහත දැක්වෙන වේලාවේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01. බස්නාහිර පළාතේ, (කොළඹ ලියාපදිංචි කොට්ඨාසය ඇතුළත) කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පංචිකාවත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසය ඇතුළත, කොළඹ මහ නගර සභා සීමාවේ පිහිටා ඇත්තා වූ ද බලයලත් මිනින්දෝරු එම්. බාලක්‍රිෂ්නන් විසින් සාදන ලද 1990 පෙබරවාරි මස 16 දින අංක 431 දරන සහාධිපත්‍ය පිඹුරේ පංචිකාවත්ත පාර, වරිපනම් අංක 226 1/1 දරන පළමු මහලේ “3 වන ඒකකය” දරන බෙදා වෙන් කළ පරිශ්‍රය වේ.

විශාලත්වය (වර්ග අඩි 2944)

**වර්ෂ 2026 ක් වූ සැප්තැම්බර් මස 24 දින පෙ.ව. 11.00 ට,**

ලියාපදිංචි අංක PQ48 දරන පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් ආයතනය වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඩී. ජේ. එස්. මායාදුන්න විසින් සහතික කරන ලද 2013 ජූලි මස 19 දින අංක 392 දරන ප්‍රාථමික වල උකස් බැඳුම්කරය මත ද, 2016 ජනවාරි මස 07 දින අංක 952 දරන ද්විතීය වල උකස් බැඳුම්කරය මතද, 2016 සැප්තැම්බර් මස 28 වන දින අංක 1166 දරන තෘතීය වල උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ආපසු ගෙවීම බන්දුල ට්‍රේඩින් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් "බන්ධනදායී" වශයෙන් ද, ගල්හේනගේ බන්දුලසේන යන අය "උකස්කරු" වශයෙන් ද පැහැරහැර ඇති හෙයින්ද;

***දේපළට පිවිසෙන මාර්ගය -:***
කොල්ලුපිටිය පැන් ඒෂියා බැංකුව ප්‍රධාන කාර්යාලයේ සිට ටවුන්හෝල් සහ පංචිකාවත්ත පාරේ මරදාන හන්දියේ සිට මීටර් 550ක් ගොස් අදාළ සහාධිපත්‍ය දේපළ දකුණු අත පැත්තේ පිහිටා ඇත. අදාළ ඒකකය මෙම ගොඩනැගිල්ලේ පළමු මහලේ පිහිටා ඇත. එය මරදාන දුම්රිය ස්ථානයට මීටර් 350ක් සහ කොළඹ කොටුව සිට කිලෝ මීටර් 2.75ක් පමණ දුරින් පිහිටා ඇත.

සහ

02. බස්නාහිර පළාතේ, (කොළඹ ලියාපදිංචි කොට්ඨාසය ඇතුළත), කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාවේ, කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පංචිකාවත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුළත පිහිටා ඇත්තා වූ ද, බලයලත් මිනින්දෝරු එම්. බාලක්‍රිෂ්නන් විසින් සාදන ලද 1990 පෙබරවාරි මස 16 දින අංක 431 දරන සහාධිපත්‍ය දේපළ පිඹුරේ පංචිකාවත්ත පාර වරිපනම් අංක 228 දරන බිම් මහලේ පිහිටි "ඒකක 2" ලෙස ලකුණු කර ඇති බෙදා වෙන් කළ පරිශ්‍රය වේ.

විශාලත්වය (වර්ග අඩි 1623.87)

**වර්ෂ 2026 ක් වූ සැප්තැම්බර් මස 24 දින පෙ.ව. 11.30 ට,**

ලියාපදිංචි අංක PQ48 දරන පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී ආයතනය වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඩී. ජේ. එස්. මායාදුන්න විසින් සහතික කරන ලද 2013 සැප්තැම්බර් මස 09 වන දින අංක 423 දරන ප්‍රාථමික වල උකස් බැඳුම්කරය මතද, 2014 සැප්තැම්බර් මස 11 දින අංක 619 දරන ද්විතීය වල උකස් බැඳුම්කරය මතද 2016 ජනවාරි මස 07 වන දින අංක 950 දරන තෘතීය වල උකස් බැඳුම්කරය මතද සහ 2016 සැප්තැම්බර් මස 28 දින අංක 1164 දරන සිව්වන වල උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ආපසු ගෙවීම බන්දුල ට්‍රේඩින් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් "බන්ධනදායී/උකස්කරු" වශයෙන් පැහැර හැර ඇති හෙයින්ද;

***දේපළට පිවිසෙන මාර්ගය -:***
කොල්ලුපිටිය පැන් ඒෂියා බැංකුව ප්‍රධාන කාර්යාලයේ සිට ටවුන්හෝල් සහ පංචිකාවත්ත පාරේ මරදාන හන්දියේ සිට මීටර් 550ක් ගොස් අදාළ සහාධිපත්‍ය දේපළ දකුණු අත පැත්තේ පිහිටා ඇත. අදාළ ඒකකය මෙම ගොඩනැගිල්ලේ බිම් මහලේ පිහිටා ඇත. එය මරදාන දුම්රිය ස්ථානයට මීටර් 350ක් සහ කොළඹ කොටුව සිට කිලෝ මීටර් 2.75ක් පමණ දුරින් පිහිටා ඇත.

***යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා -:***
2026.05.15 දින රජයේ *ගැසට් පත්‍රයද*, 2026.05.14 දිනැති දිවයින, දි අයිලන්ඩ් හා තිනක්කුරල් යන පුවත්පත් ද බලන්න.

***ගෙවීමේ ක්‍රමය :-***
වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේම පහත සඳහන් වියදම්, මුදලින් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්) ;
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද (සියයට එකයි) සහ වැට් බද්ද ද ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්) ;
4. ප්‍රචාරක වියදම් ද ;
5. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව ද ;
6. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව හා වෙන්දේසියට අදාළ වෙනත් ගාස්තු ද,

වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගැනුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතුය. එකී 90% ක ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ හිමිකම් ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාළ තොරතුරු සඳහා :
කළමනාකරු - ණය අය කර ගැනීම් අංශය,
පැන් ඒෂියා බැංකිං කෝපරේෂන් පී.එල්.සී.,
ප්‍රධාන කාර්යාලය,
අංක 450,
ගාලු පාර, කොළඹ 03.
දුරකතන අංක : 011 4667220/0114667227.

බී. එම්. ආර්. බස්නායක,
උසාවි කොමසාරිස් සහ බලයලත් වෙන්දේසිකරු.

අංක 7/2/41,
දෙවන මහල,
සුපිරි වෙළඳ සංකීර්ණය,
බොරැල්ල, කොළඹ 08.
දුරකතන අංක : 071 8047659.

08-274

**ඩීඑෆ්සීසී බැන්ක් පී.එල්.සී.**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ඩීඑෆ්සීසී බැන්ක් පී.එල්.සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මා වෙත පවරන ලද බලය ප්‍රකාරව "ටී.එම්. එන්ටර්ප්‍රයිසස්" යන නාම අභිධානය සහ විලාසය යටතේ අනුරාධපුරයේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන තිලයම්පලම් මහාදේවන් *හෙවත්* තිල්ලියම්පලම් මහාදේවන් *හෙවත්* තිල්ලයිඅම්පලම් මහාදේවන් යන අය බන්ධනදායින් වශයෙන් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී නමට ප්‍රසිද්ධ නොතාරිස් එන්. ඒ. කුරේරා විසින් සියල්ල ලියා සහතික කරන ලද 2016.05.06 දිනැති අංක 7641, 2016.05.06 දිනැති අංක 7643, 2017.10.09 දිනැති අංක 8429, 2013.10.26 දිනැති අංක 6280 සහ 2016.05.06 දිනැති අංක 7645 දරන උකස් බැඳුම්කරයන් මගින් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වෙත උකස් කර ඇති පහත විස්තර වන දේපළ, එම දේපළ පිහිටි ස්ථානයන්හි දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**පළමු විකිණීම**

**වර්ෂ 2026 ක් වූ සැප්තැම්බර් මස 17 දින ප.ව. 12.15 ට,**

**අංක 7641, 7643 සහ 8429 දරන උකස් බැඳුම්කරයන් මගින් උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහ නගර සභා පරිපාලන බලසීමාව ඇතුළත කොටහේන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කොච්චිකඩේ දකුණ කොට්ඨාස 19 හි පැරණි යොන් වීදිය (Old Moor Street) පිහිටි පැරණි යොන් වීදිය, වරිපනම් අංක 72 දරන බලයලත් මිනින්දෝරු පී. සින්නතම්බි විසින් සාදන ලද, එම මිනින්දෝරුවරයා විසින්ම 2016.01.11 දින නැවත සනාථ කරන ලද 1991.01.17 දිනැති අංක 3011 දරන පිඹුරේ දැක්වෙන ලොට් 1 වශයෙන් ලකුණු කොට බෙදා වෙන්කරන ලද ඉඩම් කොටස සහ ටී. මහාදේවන් හිමිකම් කියන එහි පිහිටි නිවස, ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ඇතුළු අනෙකුත් සියලුම දේ ද සමග වේ.

ඉඩමේ ප්‍රමාණය පර්චස් 7.925

මෙම දේපළ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

***දේපළට පිවිසීම -:***

පිටකොටුවේ සිට සවුන්ඩසර් ප්ලේස් (Saunders Place) පාර දිගේ මීටර් 800ක් පමණ ඉදිරියට ගොස්, මහජන වෙළඳ සංකීර්ණය (Peoples Shopping Complex) සහ ඩෑම් වීදිය (Dam Street) පසුකර දකුණට හැරී ඕල්ඩ් වීදියට (Old Street - මෙය ඒක පාර්ශ්වික/එක් අතකට පමණක් ධාවනය කළ හැකි මාර්ගයකි.) ඇතුළු විය යුතුය. එවිට දකුණු පසින් ඕල්ඩ් මූර් වීදියේ (Old Moor Street) වරිපනම් අංක 72 දරන අදාළ දේපළ පිහිටා ඇත.

**දෙවන විකිණීම**

**වර්ෂ 2026 ක් වූ සැප්තැම්බර් මස 18 දින පෙ.ව. 9.30 ට,**

**අංක 7645 සහ 6280 දරන උකස් බැඳුම්කරයන් මගින් උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය**

ඉතා වටිනා දේපළක්, උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නුවරගම් පළාතේ, නුවරගම්පළාත නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කනදරා කෝරළේ, ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වර්තමානයේ අනුරාධපුර මහ නගර සභා බලසීමාව ඇතුළත පියවර II-4 කොටසේ 254 හි අනුරාධපුර නව නගරය පියවර II හි පිහිටි (අනුරාධපුර නගර සභාවේ වැඩ බලන මිනින්දෝරු අධිකාරි එස්. විජේරත්න විසින් සාදන ලද 1979.11.22 දිනැති UC 3 දරන පිඹුරේ ලොට් 14 වශයෙන් ලකුණු කරන ලද ඉඩමේ නැවත මැනීමක් සහ මායිම් ලකුණු කිරීමක් වන) වනියන්කුලම කැලේ නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. එම්. බී. රත්නසිරි විසින් සාදන ලද 2004.02.02 දිනැති අංක 1585 දරන පිඹුරේ ලොට් 01 වශයෙන් ලකුණු කොට බෙදා වෙන්කරන ලද ඉඩම් කොටස සහ ටී. මහාදේවන් හිමිකම් කියන එහි පිහිටි ගොඩනැගිලි, ඇතුළු අනෙකුත් සියලුම දේ ද සමග වේ.

ඉඩමේ ප්‍රමාණය : පර්චස් 15.46

මෙම දේපළ අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

***දේපළට පිවිසීම -:***

අනුරාධපුර කඩ 50 හන්දියේ සිට ගුවන්තොටුපොළ පාර (airport Road) දිගේ මීටර් 150ක් පමණ දුරක් ගොස් දකුණට හැරී බුද්ධගයා මාවතට පිවිසෙන්න. ඉන්පසු බුද්ධගයා මාවත දිගේ මීටර් 5ක් පමණ ඉදිරියට ගොස් නැවත වමට හැරී මාටින් වික්‍රමසිංහ මාවතට පිවිසෙන්න. ඉන් අනතුරුව අදාළ දේපළ වෙත ළඟාවීම සඳහා එම මාර්ගය දිගේ මීටර් 10ක් පමණ ඉදිරියට ගමන් කරන්න. මෙම අදාළ දේපළ මාර්ගයේ දකුණු පසින් පිහිටා ඇති අතර, එය වැඩ අධිකාරි (Superintendent of Work) විසින් පිළියෙල කරන ලද යූ.සී.3 (U.C. 3) දරන සැලැස්මේ ලොට් අංක 14 දරන ඉඩම් කොටස වෙයි.

***යෝජනා සම්මුතිය සඳහා -:***

2026.05.15 දින රජයේ *ගැසට් පත්‍රය* ද, 2026.04.27 දින දිවයින, ද අයිලන්ඩ් හා තිනකුරල් යන පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය :-*
මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්) ;
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්) ;
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය ;
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 3,000/-;
6. විකුණුම් කොන්දේසි සහතික කිරීම සඳහා නොතාරිස් ගාස්තුව,

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරුබදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවා ද සමඟ වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

එකී 90% ක් වූ ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

*හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න :-*
කළමනාකරු - පුනරුත්තාපන හා ණය අයකිරීම් අංශය,
ඩීඑෆ්සීසී බැංක් පී.එල්.සී.,
අංක 73,
ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.
දුරකථන අංක : 011 2371371.

පූර්ව දැනුම් දීමකින් තොරව ඉහත වෙන්දේසි විකිණීම අත්හිටුවීමට/අවලංගු කිරීමට බැංකුවට අයිතිය ඇත.

එන්. යූ. ජයසූරිය,
වෙන්දේසිකරු හා උසාවි කොමසාරිස්.

ජයසූරිය ඇන්ඩ් ජයසූරිය ඔක්ෂනියර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 369/1,
දුටුගැමුණු මාවත,
මාවිල්මඩ,
මහනුවර,
දුරකතන අංක : 081-2210595/077-3067360/077 6447848.

08-275

**නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී.**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මා වෙත පවරන ලද බලය ප්‍රකාරව වර්ණකුලසූරිය ආරච්චිගේ හිමාලි කුලතිලක අය බන්ධනදායී/උකස්කරු වශයෙන් නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී නමින් කළුතර ප්‍රසිද්ධ නොතාරිස් තුසර නලින්ද ජයකොඩි විසින් ලියා සහතික කරන ලද 2017 ඔක්තෝබර් මස 14 වැනි දින අංක 1673 දරන උකස් බැඳුම්කරය මගින් නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී වෙත උකස් කර ඇති පහත විස්තර වන දේපළ,

**වර්ෂ 2026 ක් වූ සැප්තැම්බර් මස 25 දින ප.ව. 3.00** ට,

එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර තොටමුණ උතුරේ, කළුතර බද්දේ කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කළුතර නගර සභා සීමාව තුළ සහ කළුතර උතුර 725 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කළුතර වේලපුර පිහිටි ගාලු පාර, වරිපනම් අංක 309 දරන කඩවත්පිටියේවත්ත *හෙවත්* පරන්ගියාවත්ත *හෙවත්* බෝකුපරන්ගියාවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඩී. එල්. විජේනායක විසින් මැන සාදන ලද වර්ෂ 2017 පෙබරවාරි මස 02 දිනැති අංක 3674 පිඹුර ප්‍රකාර ලොට් 2 (බලයලත් මිනින්දෝරු කේ. ඩී. එල්. විජේනායක විසින් මැන සාදන ලද වර්ෂ 2003 පෙබරවාරි මස 12 දිනැති අංක 1770 දරන පිඹුර ප්‍රකාර ලොට් 02 නැවත මැන සාදන ලද) දරන ඉඩම සහ ඒ තුළ පිහිටි පස්, ගසකොළන්, වගාවන් ඇතුළු සියලුම දේ.

ඉඩමේ ප්‍රමාණය - පර්චස් 17.77

මෙය කළුතර ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ වෙළුම්/පත්ඉරු C 192/74 හි ලියාපදිංචි කර ඇත.

*දේපළට පිවිසීම -:*
කළුතර නගර මධ්‍යයේ ඇති ඔරලෝසු කණුව හන්දියේ සිට නාගොඩ දෙසට කිලෝමීටරයක් පමණ ඉදිරියට යන විට වම් අත පැත්තේ හොලි ක්‍රොස් විද්‍යාලයීය ක්‍රීඩාංගනය හමුවේ. අදාළ දේපළ පිහිටා ඇත්තේ එම ක්‍රීඩාංගනයට යාබද පරිශ්‍රයේ ය. (ක්‍රීඩාංගනය සහ පීසා හට් ආයතනය අතර)

*යෝජනා සම්මුතිය සඳහා -:*
2026.05.29 දින රජයේ *ගැසට් පත්‍රය* ද, 2026.05.22 දින දිවයින,

ද අයිලන්ඩ් හා තිනකුරල් යන පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය :-*
මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්) ;
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු ;
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්) ;
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය ;
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 3,000/-;
6. විකුණුම් කොන්දේසි සහතික කිරීම සඳහා නොතාරිස් ගාස්තුව,

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරුබදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වේතොත් ඒවා ද සමඟ වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

එකී 90% ක් වූ ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

*හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න :-*
කළමනාකරු - නීති අංශය,
නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී.,
අංක 46/58,
නවම් මාවත,
කොළඹ 08.
දුරකථන අංක : 011 4682502.

පූර්ව දැනුම් දීමකින් තොරව ඉහත වෙන්දේසි විකිණීම අත්හිටුවීමට/අවලංගු කිරීමට බැංකුවට අයිතිය ඇත.

එන්. යූ. ජයසූරිය,
වෙන්දේසිකරු හා උසාවි කොමසාරිස්.

ජයසූරිය ඇන්ඩ් ජයසූරිය ඔක්ෂනියර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 369/1,
දුටුගැමුණු මාවත,
මාවිල්මඩ,
මහනුවර,
දුරකතන අංක : 081-2210595/077-3067360/077 6447848.

08-276

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.**
**මහනුවර ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වගන්තිය යටතේ විකිණීමේ නිවේදනය

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. අධ්‍යක්ෂක මණ්ඩලය විසින් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නිසි ලෙස සංස්ථාගත කරන ලද සමාගමක් වන එහි ලියාපදිංචි කාර්යාලය සහ/හෝ ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය අංක 52/1/ඩී, නව නුවර පාර, කොතලාවල, කඩුවෙල සහ අංක 4, කුමුදු මාවත, ප්‍රිම්රෝස් ගාර්ඩන්ස්, මහනුවර යන ස්ථානයේ පිහිටා ඇති සීමාසහිත බයෝ ෆුඩ්ස් (පෞද්ගලික) සමාගම බන්ධනදායී වශයෙන්,

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඩී. ඉලංගසිංහ විසින් ලියා සහතික කරන ලද 2008.07.10 දිනැති අංක 4669, 2009.06.24 දිනැති අංක 4905 උකස් බැඳුම්කර සහ මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. පී. බී. සිරිවර්ධන විසින් සහතික කරන ලද 2014.02.19 දිනැති අංක 4292 දරන උකස් බැඳුම්කරය සහ මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් කේ. වී. ඒ. ඩී. සී. කේ. විපුලසේන විසින් ලියා සහතික කරන ලද 2015.07.14 දිනැති අංක 1583 සහ අංක 1584 දරන අතිරේක උකස් බැඳුම්කරයන් මගින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් සුරක්ෂිත කර ඇති පහත පළමුවන උපලේඛනයේ විස්තර වන දේපළ,

සහ මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් කේ. ඩී. ඉලංගසිංහ විසින් ලියා සහතික කරන ලද 2005.07.20 දිනැති අංක 3688 සහ 2011.03.24 දිනැති අංක 5469 දරන උකස් බැඳුම්කරයන් සහ මහනුවර ප්‍රසිද්ධ නෙතාරිස් කේ. වී. ඒ. ඩී. සී. කේ. විපුලසේන විසින් ලියා සහතික කරන ලද 2015.07.14 දිනැති අංක 1587 සහ අංක 1588 දරන අතිරේක උකස් බැඳුම්කරයන් මගින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් සුරක්ෂිත කර ඇති පහත දෙවන උපලේඛනයේ විස්තර වන දේපළ,

සහ මාතලේ ප්‍රසිද්ධ නොතාරිස් අයි. එච්. බී. ඩී. විජේකෝන් විසින් ලියා සහතික කරන ලද 2005.10.11 දිනැති අංක 4017 දිනැති උකස් බැඳුම්කරයන් සහ මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් කේ. වී. ඒ. ඩී. සී. කේ. විපුලසේන විසින් ලියා සහතික කරන ලද 2015.07.14 දිනැති අංක 1585 සහ අංක 1586 දරන අතිරේක උකස් බැඳුම්කරයන් මගින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් සුරක්ෂිත කර ඇති පහත තෙවන උපලේඛනයේ විස්තර වන දේපළ,

සහ මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. පී. බී. සිරිවර්ධන විසින් ලියා සහතික කරන ලද 2014.02.19 දිනැති අංක 4294 සහ 2015.03.13 දිනැති අංක 4760 දරන අතිරේක උකස් බැඳුම්කරයන් මගින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් සුරක්ෂිත කර ඇති පහත හතරවන උපලේඛනයේ විස්තර වන දේපළ,

සහ මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. පී. බී. සිරිවර්ධන විසින් ලියා සහතික කරන ලද 2014.02.19 දිනැති අංක 4293 සහ 2015.03.13 දිනැති අංක 4761 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. නමින් වූ උකස් බැඳුම්කරයන් මත සීමාසහිත බයෝ ෆූඩ්ස් (පෞද්ගලික) සමාගම බන්ධනදායී වශයෙන් ලබා ගන්නා ණය පහසුකම් වෙනුවෙන් සුරක්ෂිත කර ඇති පහත පස්වන උපලේඛනයේ විස්තර වන යන්ත්‍රෝපකරණ;

එම දේපළ හා යන්ත්‍රෝපකරණ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**දෙවන විකිණීම**

**වර්ෂ 2026 ක් වූ සැප්තැම්බර් මස 29 දින ප.ව. 12.30 ට,**

